# නියමුවා

ISSN 1391 - 1031 | 2025 අගෝස්තු | 29 වෙළුම | 04 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=

# අපේ අපේක්ෂාව

# සමෘද්ධිමත් ඉන්දියානු සාගර කලාපයක්

ශ්‍රී ලංකාවේ හවුල්කාරිත්වය කලාපීය අසල්වැසි රාජ්‍යයන් අතර සහයෝගීතාවේ පිළිබිඹුවක් බව තමන් තරයේ විශ්වාස කරන බව පෙන්වා දුන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම හෝ නීල ආර්ථික මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම හෝ වේවා බහුපාර්ශ්වීය සංසදවල සහයෝගයෙන් කටයුතු කිරීම හෝ වේවා ඒ කවර ආකාරයෙන් වුවද සාමකාමී, සමෘද්ධිමත් සහ තිරසර ඉන්දියානු සාගර කලාපයක් නිර්මාණය කිරීම සඳහා මාලදිවයින ඇතුළු කලාපීය රටවල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටින බව අවධාරණය කළේය.

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේ තෙදින (28-30) මාලදිවයින් රාජ්‍ය සංචාරය අතරතුර මාලදිවයින් ජනාධිපති ආචාර්ය මොහමඩ් මුයිසු මහතා විසින් කුරුම්බා මෝල්ඩිව්ස් නිවාඩු නිකේතනයේ සංවිධානය කරන ලද විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයෙන් අනතුරුව අදහස් දක්වමිනි. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

ශ්‍රී ලංකාවේ සමීපතම මිතුරකු සහ පාර්ශ්වකරුවකු ලෙස දීර්ඝ කාලයක් මුළුල්ලේ අප සමඟ සබඳතා පැවැත් වූ රාජ්‍යයක් වන සුන්දර මාලදිවයින වෙත පැමිණීමට ලැබීම මම මහත් ගෞරවයක් ලෙස සලකනවා.

මට සහ මගේ දූත පිරිස වෙත ලබා දුන් ආගන්තුක සත්කාරය වෙනුවෙන් ජනාධිපතිතුමාට සහ මාලදිවයින් රජයට මම කෘතඥතාව පළ කිරීමට කැමතියි. මගේ මේ මාලදිවයින් සංචාරය අප දෙරට එක්සත් කරන දීර්ඝකාලීන මිත්‍ර සබඳතා, එකිනෙකා කෙරෙහි ඇති ගෞරවය සහ අපගේ පොදු අපේක්ෂා යළි තහවුරු කරන සංචාරයක්. ඉන්දියානු සාගරයේ අසල්වැසි රාජ්‍යයන් ලෙස අප දෙරටේ ඉදිරි ගමන් මඟ එකිනෙකා සමඟ බැඳී පවතිනවා. කාලයේ ඇවෑමෙන් අපගේ ජනතාව අතර වර්ධනය වී ඇති අන්‍යෝන්‍ය සුහදශීලි බව, අවබෝධය සහ ඥාතීත්වය අද්විතීය බැඳීමක් නිර්මාණය කර තිබෙනවා. අද මෙම සබඳතා රාජ්‍යතාන්ත්‍රිකභාවය සහ බහුවිධ ක්ෂේත්‍රවල සක්‍රීය සහයෝගීතා ඔස්සේ අඛණ්ඩව පෝෂණය වෙනවා. අප දෙරට අතර ශක්තිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇරඹීමේ 60 වන සංවත්සරය මෙම මාසයේදී සමරනවා.

1965 වසරේදී මාලදිවයින නිදහස ලබා ගැනීම, දකුණු ආසියානු ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරනවා. මාලදිවයින් නිදහස් ප්‍රකාශනයට අත්සන් තැබීම ලංකාවේදී සිදු කිරීමට අවස්ථාව සලසා දීමෙන් එම ඓතිහාසික ක්‍රියාවලියේ වැදගත් කාර්යභාරයක් ඉටු කිරීම පිළිබඳ ශ්‍රී ලංකාව අභිමානයට පත් වෙනවා. එමෙන්ම කීර්තිමත් ශ්‍රී ලාංකික ගාන්ධර්ව දිවංගත පණ්ඩිත් ඩබ්ලිව්.ඩී. අමරදේව සූරින් විසින් නිදහස් මාලදිවයිනේ ජාතික ගීයේ තනු නිර්මාණය කරනු ලැබීම අපගේ ආඩම්බරයට හේතු වෙනවා.

අතිගරු ජනාධිපතිතුමනි, අපේ හවුල්කාරිත්වය කලාපීය අසල්වැසි රාජ්‍යයන් අතර සහයෝගීතාවේ පිළිබිඹුවක් බව මා තරයේ විශ්වාස කරනවා. සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම හෝ නීල ආර්ථික මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම හෝ වේවා බහුපාර්ශ්වීය සංසදවල සහයෝගයෙන් කටයුතු කිරීම හෝ වේවා ඒ කවර ආකාරයෙන් වුවද සාමකාමී, සමෘද්ධිමත් සහ තිරසර ඉන්දියානු සාගර කලාපයක් නිර්මාණය කිරීම සඳහා මාලදිවයින සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටිනවා.

ගරු ජනාධිපතිතුමා මා වෙත පැවසුවා ජනාධිපතිතුමාගේ ඉංග්‍රීසි ගුරුවරයා සහ භෞතික විද්‍යා ගුරුවරයා ශ්‍රී ලාංකිකයන් බව. ඒ පිළිබඳව මම ආඩම්බර වෙනවා. විවිධ මට්ටමින් මාලදිවයින් ආර්ථිකයටද, සමාජ ප්‍රගමණයටද දායක වූ එසේ නොමැති නම් ගුරුවරුන් ලෙස පරම්පරා ගණනාවකට දැනුම ලබා දුන් දහස් ගණනක් වූ ශ්‍රී ලාංකිකයන් පිළිබඳව අපි ආඩම්බර වෙනවා. මාලදිවයිනේදී ශ්‍රී ලාංකිකයන්ට ලැබී ඇති ගෞරවය අප බෙහෙවින් අගය කරනවා. එමෙන්ම, සිය දෙවෙනි නිවහන ලෙස සලකා ශ්‍රී ලංකාවේ අපගේ පාසල්වල සහ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හදාරන, වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්නා හෝ අප දිවයිනේ සංචාරක සහ ආගන්තුක සත්කාර භුක්තිවිඳින මාලදිවයින් ජාතිකයින් අපි අගය කරනවා. ඔවුන් හුදෙක් එකිනෙකාගේ රටවල වාසය කරන විදේශිකයන් පමණක් නොව අපගේ ජාතීන් යා කරන පාලම්ද වෙනවා.

**ජනපති අනුර කුමාර දිසානායක සහෝදරයා**

සංචාරක ව්‍යාපාරය අප දෙරටේ ආර්ථිකයේ ප්‍රධාන අංගයක් වෙනවා. ශ්‍රී ලංකාව සංචාරක ගමනාන්තයක් කර ගත් ඉහළම රටවල් දහය අතර මාලදිවයිනද සිටිනවා. මෑත වසරවලදී මාලදිවයින් සංචාරකයන්ගේ පැමිණීමේ වර්ධනයක් දක්නට ලැබීම පිළිබඳව අපි සතුටට පත් වෙනවා. දෙවන නිවහනක අත්දැකීම් විඳගැනීමට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස අපි මාලදිවයින් සංචාරකයන්ට ආරාධනා කරනවා.

අනාගතය දෙස නෙත් යොමන විට අප දෙරට මිතුරන් ලෙස පමණක් නොව, පොදු දැක්මකින් සහ පොදු අරමුණකින් එක්සත් වූ හවුල්කරුවන් ලෙස එකිනෙකාට සමීපව ප්‍රගමණය කරා ගමන් කරනු ඇතැයි යන්න මගේ විශ්වාසයයි. මෙම සංචාරය අප දෙරට අතර වඩාත් ගැඹුරු සහයෝගීතාවක්, පුළුල් අවබෝධයක් සහ වඩා යහපත් මිත්‍රත්වයක් සඳහා මඟපාදනු ඇතැයි මම විශ්වාස කරනවා.



2025.07.28 දින මාලේ ජනරජ චතුරස්‍රයේදී ජාතික ආරක්ෂක බලකා ආචාර පෙළපාලිය නිරීක්ෂණය කරමින්...



## 03 අපේ අවසන් අරමුණ ශ්‍රී ලාංකේය...

අඳුරු යුගයක් පහු කරලා අපි මේ වෙනකොට ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා. රටක් වශයෙන් අපි දැන් ඉන්නෙ තවදුරටත් අපිව ජාතීන් වශයෙන්, ආගම් වශයෙන් වෛරය ඇති කරලා බෙදන්න බැහැ...



## 05 වෙනස් කිරීම හා...

ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම බරපතළ වෙනස්කම් සිදුවිය යුතුය. රාජ්‍ය සේවයේ අරමුණු හා ක්‍රියාකාරිත්වය වෙනස් විය යුතුය. මහජනයා සඳහා සේවය කරන ආයතනවල ආකල්ප වෙනස් විය යුතුය. දැඩි මූල්‍ය විනයක් ඇති කළ යුතුය. මහපාරේ විනය (වාහන හා මගීන්) ඇති කළ යුතුය. ජනතාව සිතන ආකාරයන්...



## 07 ජනතා බදු මුදල්...

පසුගිය කාලය මුළුල්ලේම බදු ගෙවන්නන් බදු ගෙවූයේ බලහත්කාරය නිසාමය. ඒ අතර තමන්ට කිසිදු දේශපාලන සම්බන්ධකමක් නොමැති, නීතියට අවනත සාධාරණ පුරවැසියෝ අකමැත්තෙන් වුවද බදු ගෙවූහ. සමහර පුද්ගලයෝ දේශපාලන සම්බන්ධකම් මත බදු ගෙවීම සම්පූර්ණයෙන් පැහැර...





තරුණ.................................... 04
ජාත්‍යන්තර.......................... 06
කාන්තා.................................... 08
වේදිකාව ............................ 09
විශේෂාංග.......................... 10


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

## සටන් බිම

# පක්ෂ සංවර්ධන අරමුදල වෙනුවෙන් කැට එකතු කෙරේ




"අපේ පක්ෂය අපේ දැතින්" පක්ෂ සංවර්ධන අරමුදල සඳහා වර්ෂිකව සිදුකරන ලබන කැට එකතු කිරීමේ වැඩසටහන යටතේ කැට එකතු කිරීම වෘත්තීය සමිති නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පසුගියදා කොළඹදී සිදුකරනු ලැබිණි. සමාජවාදී කම්කරු සංගමය මගින් සිදුකරනු ලැබූ මෙම වැඩසටහන වාර්ෂිකව සිදු කරනු ලබන අතර මේ සඳහා සාමාජික සාමාජිකාවෝ රැසක් සහභාගි වූහ.

# වෘත්තීය සමිති නියෝජිතයෝ ඉන්දියාවට




ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා වඩාත් පුළුල් කරමින් ඉන්දියානු රජයේ ආරාධනයකට අනුව කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් සංවිධානය කරන ලද වැඩසටහනක් සඳහා විවිධ පක්ෂ නියෝජනය කරමින් තරුණ දේශපාලන නායකයෝ පිරිසක් පසුගිය ජූලි 13 වන දින ඉන්දියාව බලා පිටත්වූහ. ශ්‍රී ලංකාවේ තරුණ දේශපාලකයන්ගේ ඉන්දියානු සංචාරය ජූලි 13 - 26 දක්වා ඉන්දියාවේ නව දිල්ලි, ගයා, පැට්නා, බැංගලෝර් යන ප්‍රධාන නගර කේන්ද්‍ර කොටගෙන පැවැත්වුණු අතර මෙම වැඩසටහන සඳහා කම්කරු සංගමය නියෝජනය කරමින් චලිත් අමරදිවාකර, දිනේෂ් වික්‍රමරත්න, සඳුනි දිලික්ෂි, අනූෂා දිල්රුක්ෂි යන සහෝදර සහෝදරියන් හා සමාජවාදී තරුණ සංගමය නියෝජනය කරමින් සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික මෙත්ශාන් සමරවීර සහෝදරයා සහ දුමින්ද අමරසිංහ සහෝදරයාත්, සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් ශෂිප්‍රභා ජයකොඩි යන සහෝදර සහෝදරියෝ එක්ව සිටියහ.

# විශ්‍රාමිකයින්ගේ විශ්‍රාම වැටුප ඉහළට



2016-2019 විශ්‍රාමිකයින් ඇතුළු ලක්ෂ 5කට පමණ තිබූ විශ්‍රාම වැටුප් ගැටලුව, 2025 අයවැයෙන් අදියර 3කින් විසඳීමට කටයුතු කර ඇති බවත් ඊට අදාල චක්‍රලේඛය නිකුත් කර ඇති අතර ඒ අනුව 2025 ජූලි මස සිට ගෙවීම ආරම්භ කර ඇති බවත් විශ්‍රාමිකයින්ගේ හිමිකම් සුරැකීමේ ජාතික සංවිධානයේ ලේකම් සරත්ලාල් පෙරේරා සහෝදරයා පවසයි. මෙම විශ්‍රාම වැටුප් ලැබීම මගින් ශ්‍රේණීන් අනුව විශ්‍රාමිකයින්ට විශාල ලෙස වැටුප් වැඩි වී ඇති බවත් මේ වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මෙම සංශෝධනය වී ඇති ආකාරය පිළිබඳ වාර්තාවක් විශ්‍රාමිකයන්ට ලබාදීමට කටයුතු කරමින් සිටින බවත් සරත්ලාල් සහෝදරයා පවසයි.

# අධ්‍යාපන සමුපකාරයේ විශාල දූෂණ රැසක් හෙළිවෙයි




අධ්‍යාපන සමුපකාරය පරිගණක ගත කිරීමේදී සිදුව ඇති දූෂණය ඇතුළුව පසුගිය පාලන කාලය තුළ විශාල දූෂණයන් රැසක් සිදුව ඇති බව එහි සභාපති ලාල්කුමාර සහෝදරයා පවසයි. පසුගිය කාලය තුළ පරිගණක ගත කිරීම් වෙනුවෙන් යැයි කියමින් විවිධ උපදේශන සමාගම්වලට මිලියන 69ක් පමණ ගෙවීමේදී විශාල දූෂණයක් සිදුව ඇති බව ප්‍රකාශිතය. එමෙන්ම ආයතනයේ වහලය ඇතුළු ඉදිකිරීම් සිදුකිරීම වෙනුවෙන්ද මිලියන 11 ක් පමණ විශාල මුදලක් ගෙවා ඇති නමුත් එම ඉදිකිරීම් නැවත ගලවා දැමීමට සිදුව ඇති බවත් ඔහු පවසයි. මාධ්‍ය හමුවක් අමතමින් මේ බව ප්‍රකාශ කළ ඔහු කිසිදු ඉදිකිරීමක් සිදු නොකළ සමාගමකට මිලියන 45ක් ගෙවා ඇති බවය. එසේම නීති විරෝධී සේවක බඳවාගැනීම් 400ක් පමණද පසුගිය කාල වකවානුව තුළ සිදු කර ඇති බවත් පෙන්වා දෙන ලාල් කුමාර සහෝදරයා මෙම දූෂිත ගනුදෙනු සිදු කළ පහුගිය පොහොට්ටු පාලකයින්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත් වත්මන් පාලනය තුළ සාමාජිකයන්ට සහන රැසක් ලබාදීමටද කටයුතු කර ඇති බවත් මෙහිදී පැවසීය.

## ජනවරම

# සංවර්ධනයේ පිම්මකට සූදානම්

අලුතින් එක්කරන ලද සංවර්ධන ව්‍යාපෘති 21ක් සහ මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතින මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 205ක් පිළිබඳව රජය දැඩි අවධානය යොමු කර තිබේ.

මෙම වසරේ පළමු කාර්තුව තුළ එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සහ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ඒ ඒ අමාත්‍යාංශවල විශේෂ අවධානය යොමු කරමින් දැඩි නිරීක්ෂණයක් පවත්වාගෙන යාමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත. සැලසුම් කළ පරිදි නිශ්චිත කාල රාමුවක් තුළ අදාළ ව්‍යාපෘති අවසන් කිරීම සම්බන්ධයෙන් සියලුම අමාත්‍යාංශවල සහ නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණය අවශ්‍ය බව ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ප්‍රගති සමාලෝචනයන්හිදී අවධාරණය කර ඇත.

# වරාය පර්යන්ත එක්කර නව රාජ්‍ය සමාගමක්

කොළඹ වරාය තුළ පිහිටි දකුණ, නැගෙනහිර පර්යන්තය සහ බටහිර බහාලුම් පර්යන්තය එක්කරමින් සියලු මෙහෙයුම් කටයුතු සඳහා නව සමාගමක් ස්ථාපනය කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

බහාලුම් පර්යන්ත මෙහෙයුම් සහ කලමනාකරණය සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගමක් පිහිටුවීමට කටයුතු සිදුකරමින් පවතින අතර ශ්‍රී ලංකාවට උපරිම ආර්ථික වාසි සලසා ගැනීම වෙනුවෙන් කාර්යක්ෂමව මෙහෙයුම් කටයුතු සිදුකිරීම එහි ඉලක්කය වී තිබේ. එම ඉලක්කය සපුරා ගැනීම සඳහා වරාය මෙහෙයුම් කටයුතුවල යෙදී සිටින පෞද්ගලික සමාගම් සමග තරග කළ හැකි නව සමාගමක් පිහිටුවීමේ අවශ්‍යතාවය මතු වී තිබේ.

# කැනඩා සහ ශ්‍රී ලංකා පොලීසි අතර අවබෝධතා ගිවිසුමක්

ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ වැළැක්වීම සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය අවබෝධයෙන් ක්‍රියාකිරීම සඳහා රාජකීය කැනේඩියානු අශ්වාරෝහක පොලීසිය සහ ශ්‍රී ලංකා පොලීසිය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.

මෙම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව දෙරට අතර සැකකරුවන් හුවමාරු කර ගැනීම, අපරාධ පිළිබඳව තොරතුරු හුවමාරු කර ගැනීම, තාක්ෂණික සහයෝගීතාවය ලබාගැනීම සහ ඒකාබද්ධ මෙහෙයුම් දියත් කිරීමට නියමිතය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වෙනුවෙන් විදේශ කටයුතු අමාත්‍යාංශය සහ මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඒකාබද්ධව සැලසුම් සකස් කර ඇති අතර අදාළ ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත.

# දහම් පාසල් ගුරුභවතුන් ඇගයීමේ මූල්‍ය ප්‍රදානයන්

බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි සහ කතෝලික ආගම්වලට අයත් ලියාපදිංචි දහම් පාසල්වල අඛණ්ඩව වසරක් සේවය කර ඇති ගුරුභවතුන් වෙනුවෙන් නිල ඇඳුම් දීමනාවක් ලෙස රුපියල් 7500ක් වර්ෂයකට ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනෙමින් පවතී.

බුද්ධශාසන ආගමික කටයුතු සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ කැබිනට් මණ්ඩලයට සංදේශයට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව ලබන 2026 වසරේ සිට මෙම නිල ඇඳුම් දීමනාව ලබාදීමට සැලසුම් කර ඇත. වසර ගණනාවක් කිසිදු පෞද්ගලික ප්‍රතිලාභ අපේක්ෂාවකින් තොරව මෙම ගුරුභවතුන් දහම් පාසල්වල කළ සේවය ඇගයීම සඳහා මෙම දීමනාව ලබාදීම කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත.

# සාමදාන විනිශ්චයකාරවරුන් නව අර්ථයකින් බල ගැන්වේ

දිවයින පුරා පිහිටි සමථ මණ්ඩලකරුවන් සඳහා නිල බලයෙන්ම සාමදාන විනිශ්චයකාර ධුර පිරිනමමින් වඩාත් මහජන හිතකාමී ආකාරයට සිවිල් ගැටලු විසඳීම වෙනුවෙන් කැබිනට් මණ්ඩලයේ ප්‍රමුඛත්වය ලබාදී තිබේ.

සමථකරුවන් සාමදාන විනිශ්චයකාර පදවිවලට ඇතුළත් කිරීම සඳහා "2025 අංක 1 දරන සාමදාන විනිශ්චයකාර නියෝග ලබාදීම වෙනුවෙන්" අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාව සම්මත කරනු ලැබීය. ඒ යටතේ 1977 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ නියමයන්ට අනුකූලව 2025 ජූනි 13 අති විශේෂ ගැසට් පත්‍රය මගින් එම නවතම නියෝග ප්‍රකාශයට පත්කර තිබේ.

# ශ්‍රී ලංකාවේ සිසුන්ට හංගේරියාවේ ශිෂ්‍යත්ව වරම්

ශ්‍රී ලංකාව සහ හංගේරියාව අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වශයෙන් අග්‍රාමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල යෝජනාවට අනුමැතිය ලැබී ඇත.

මේ අනුව විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු විද්‍යාව, ගණිතය, වෛද්‍ය විද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව සහ කෘෂිකර්මය යන ක්ෂේත්‍රවල ප්‍රථම උපාධි පාඨමාලා අටක් සඳහා ශ්‍රී ලාංකික සිසුන්ට ඉඩකඩ සැලසේ. එමෙන්ම පශ්චාත් උපාධි අටක් වෙනුවෙන්ද ආචාර්ය උපාධි අවස්ථා හතරක් වෙනුවෙන්ද ආදී වශයෙන් ශිෂ්‍යත්ව අවස්ථා විස්සක් හංගේරියානු රජය විසින් ශ්‍රී ලාංකික සිසුන් සඳහා ලබාදීමට එකඟතාව පළ කර ඇත.

# කෘෂිකාර්මික ක්ෂේත්‍රයට මැලේසියාවේ නූතන අත්දැකීම් වෙයි

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව සඳහා නූතන විද්‍යාත්මක අවබෝධය ලබාදීමට මැලේසියාවේ කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන ආයතනය ඉදිරිපත් වී සිටී.

මෙම ආයතනයේ සහයෝගීතාව ලබාගැනීම වෙනුවෙන් වූ වසර පහක අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව පස්වසරක් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රය නවීන විද්‍යාත්මක දැනුමෙන් පොහොසත් කිරීමට සැලසුම් කර තිබේ. එම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා වූ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයාගේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

# සයිබර් අපරාධකරුවන්ට එරෙහිව දැඩි පියවර

අන්තර්ජාලය යොදා ගනිමින් සිදුකරන සංවිධානාත්මක අපරාධ වළක්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග රැසක් ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ.

ඒ අනුව ඩිජිටල් හැඳුනුම්පත් ලබාදීම කාර්යක්ෂම කිරීම, ජාතික දත්ත හුවමාරු ඩිජිටල් වේදිකාව ඉක්මනින් සකස් කිරීම සහ ශ්‍රී ලංකා රාජ්‍ය මේසය (ඛ්බන් ඨදඩැරපැබළ ඣකදමා) යන ප්‍රධාන ව්‍යාපෘති ඒකාබද්ධ කරමින් රාජ්‍ය ආයතන ඩිජිටල්කරණයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එමෙන්ම සයිබර් අවකාශයේ ආරක්ෂිතභාවය ශක්තිමත් කිරීම වෙනුවෙන් උපරිම ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිකාර සංසදය වඩාත් කාර්යක්ෂම කිරීමට ඉලක්ක කර තිබේ.

මෙම ක්‍රියාමාර්ගවලට අදාළ සැලසුම් වෙනුවෙන් ඩිජිටල් අමාත්‍යවරයා වශයෙන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල යෝජනාවට අනුමැතිය ලබා දී ඇත.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අතාර්කික විරෝධතා

අලුත් යමක් ආරම්භ කරන හැම විටම පළමුවෙන්ම එයට ගැරහීමත්, විරෝධය පෑමත්, විවේචනය කිරීමත්, පසුව එය නොසලකා හැරීමත් අවසානයේ එයම පිළිගැනීමත් සිදුවන බව වරක් මහත්මා ගාන්ධි පවසා තිබුණි. ගාන්ධිතුමා කළ එම ප්‍රකාශය සියලුම දේවලට නොගැලපුණත් සමහර දේවල් සම්බන්ධයෙන් සත්‍ය බව පෙනේ.

විශේෂයෙන්ම මේ දිනවල සකස්කරමින් යන නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විරෝධයන් දෙස බලන විට ඉහත කියමන මෙයට හොඳින්ම ගැලපෙන බව පෙනේ.

සමාජයක සමහර වෙනස්කම් කිරීමට යාමේදී වෙනස්කම් පොදුවේ ඉල්ලා සිටින අයම, එම වෙනස තමන්ට බලපාන ආකාරය අනුව පොදු අරමුණු නොසලකා ඊට ප්‍රතිචාර දක්වන බවත් සමහරු වෙනස්කම්වලට බියක් දක්වන බවත් අපි කිහිප වරක්ම අවධාරණය කර ඇත්තෙමු.

පවතින අධ්‍යාපන ක්‍රමය පිළිබඳව පසුගිය කාලයක් පුරාම විවේචන ඉදිරිපත් වූයේ ඊට කුමන හෝ සම්බන්ධයක් ඇති අයගෙන්මය. වත්මන් අධ්‍යාපන ක්‍රමය ළමුන්ට පීඩාවක් හා බරක් බව දෙමාපියන්ද ගුරුවරුන්ද විසින් නිතර ප්‍රකාශ කරනු ලැබ තිබුණි. ළමුන්ද තමන් අධ්‍යාපනය තුළ පීඩා විඳින බව ඇඟවූ වාර අනන්තය. මුළු සමාජයම පවතින අධ්‍යාපන ක්‍රමයට එරෙහි වූ අතර ළමුන්ට බරක්, පීඩාවක් වන විභාග පසුපස තරගයේ දුවන, ළමුන්ට ළමා කාලය අහිමි කරන මෙම අධ්‍යාපන ක්‍රමය වෙනස් කළ යුතු බව නිතර ප්‍රකාශ විය. 5 වසර ශිෂ්‍යත්වය පිළිබඳ දෙමාපියන්ගේ හා ළමුන්ගේ ආකල්පයද මෙලෙසම විය. දැන් වත්මන් ආණ්ඩුව සූදානම් වන්නේ සත්‍ය වශයෙන්ම ළමුන්ගේ නිර්මාණශීලීත්වය මොට කරන, ළමුන් යාන්ත්‍රික කරන, එලදායීතාවයෙන් අඩු දෙමාපියන්ටද බරක් වූ මෙම පැරණි අධ්‍යාපන රටාව වෙනස් කර අලුත් එකක් හඳුන්වා දීමටය.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මූලික පදනම සකස් වී ඇත්තේ විභාග කේන්ද්‍රීය යාන්ත්‍රික අධ්‍යාපනයක් වෙනුවට කුසලතා හා දැනුම ඇගයීමේ ක්‍රමවේදයක් හා ළමුන් අධ්‍යාපනයේ එකම පාරක යනවා වෙනුවට ළමුන්ට 9 වසරෙන් පසු තමන් කැමති අධ්‍යාපනික මාවතක් තෝරා ගැනීමට ඉඩ දෙන රටට හොඳ පුරවැසියෙක්, තාර්කික මිනිසෙක්, රසවින්දනය, ගුණධර්ම සහිත පරපුරක් බිහිකරන අධ්‍යාපන ක්‍රමයකට යාමය.


අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රටේම ළමුන් වෙනුවෙන් නිසා ඒ පිළිබඳව සමාජය තුළ සාධනීය සංවාදයක් පැවතීම හා අවශ්‍ය නිවැරදි කර ගැනීම් හා සංශෝධන සඳහා යෝජනා ඉදිරිපත් වීම ඉතා හොඳ දෙයකි. සමහර අඩුපාඩුකම්, දුර්වලතාවයන් නිවැරදි කරගත හැක්කේ එවිටය. එහෙත් ඒවා කළ යුත්තේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණුවලට හානි නොවන සේය.

එහෙත් මේ දිනවල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සිදුවන සමහර මත දැක්වීම් දෙස බලන විට පෙනෙන්නේ ඉන් බොහොමයක් කිසිවක් හරිහැටි නොදැන බොරු බියක් විසින් ඇති කළ ඒවා බවය. ආණ්ඩුවේ සියල්ලටම විරුද්ධ වීම තම එකම ප්‍රතිපත්තිය කරගත් 'විපක්ෂය' මෙහි පෙරමුණේ සිටී. සමහර අදහස් හා විවේචන සිදුවන්නේ මේ වෙනස්කම් නිසා තම තමන්ට සිදුවන ලාබ පාඩු අනුවය. වෙනස්වීමට, ඒ වෙනුවෙන් අමතර වෙහෙසක් දැරීමට අකමැති, පවතින ක්‍රමයට හැඩ ගැසුණු ඇතැම් අයද මෙයට අතාර්කික විරෝධතා දක්වනු පෙනේ. තවත් කිහිප දෙනෙක්ගේ ප්‍රශ්නය වන්නේ අධ්‍යාපනයේ 'විශාරදයන්' වන තමන්ගෙන් මෙයට උපදෙස් නෙගැනීම, සම්බන්ධ කර නොගැනීම වැනි පාර්ශ්වීය කාරණාය.

පොදු සමාජය කරුණකට අදාළ වැදගත් වෙනසක් සඳහා පියවර තැබීමේදී පටු හා පෞද්ගලික අරමුණු මුල්කරගෙන හා කිසිවක් නොදැන එක් එක් අයගේ බියවැද්දීම්වලට යට වී මත දැක්වීම හා විරෝධයන් පෑම සිදු නොවිය යුත්තකි. එයට අදාළ බලධාරීන් යට විය යුතුද නැත.

දැන් කළ යුතු වන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හොඳින් හැදෑරීමත්, අනාගත පරපුර වෙනුවෙන් එහි සාධනීය අවශ්‍යතාව පිළිගෙන එහි පොදු දුර්වලතා හෝ ගැටලු ඇතොත් හොඳ සංවාදයකින් ඒවා නිවැරදි කර ගෙන රටේ දරු පරපුර 'අධ්‍යාපන පීඩාවෙන්' මුදවාගත හැකි, දරුවන් නිර්මාණශීලී යහපත් පුරවැසියන් බවට ගොඩනැගිය හැකි අධ්‍යාපන වෙනස්කම් ක්‍රියාවට නැගීමය.

# අපේ අවසන් අරමුණ ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීමයි



**තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක**
**එරංග ගුණසේකර සහෝදරයා**

***ජාතිවාදයෙන් මාරාන්තික ලෙස බැට කාපු රටක සහෝදරත්වයේ දුම්රිය යාපනයට ගියා. මේකේ අරමුණ මොකක්ද?***

1977 වසරෙන් පස්සේ දිගින් දිගටම පැමිණි ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් මේ බේදවාචකය 1983 දක්වා පැමිණෙනවා. 1983 කළු ජූලිය කියන්නේ හුදෙකලා සිදුවීමක් නෙවෙයි. 83ට කේන්ද්‍රගත වුණත් මේ පටන් ගන්නේ අසූව දශකයේ කළු පැල්ලම විදිහට. උතුරේ පැවති සිවිල් යුද්ධය අතරතුර 83 ජූලි 15වැනිදා දමිළ බෙදුම්වාදී ව්‍යාපාරයේ සාමාජිකයන් දෙදෙනෙක් ඝාතනය වෙනවා.

ඊට පළිගැනීමක් ලෙස 1983 ජූලි 23 වැනිදා එල්ල වන ප්‍රහාරයකට හමුදා ට්‍රක් රථයක් හා ජීප් රථයක් ඉලක්ක වෙනවා. එම ප්‍රහාරයෙන් හමුදා සෙබළුන් 13 දෙනෙක් ජීවිතක්ෂයට පත්වෙනවා. ජූලි 24 වැනිදා ආරක්ෂක අංශ හා ආණ්ඩුව මේ සිරුරු ඥාතීන්ට භාර නොදී බොරැල්ල කනත්තට ගේන්න තීරණය කරනවා. නමුත් ආණ්ඩුව කලින්ම අරන් තිබ්බ තීරණය හදිසියේම වෙනස් කරලා මේ සිරුරු ඥාතීන්ට භාර දෙනවා.

එයින් පස්සේ එවකට තිබ්බ ජේ.ආර්. ආණ්ඩුව පූර්ව අත්දැකීම්වලින් තීරණය කරනවා, මේක වෙන පැත්තකට හරවන්න. ඒ අනුව 'දැන් වැඩේ හරි, ගහන්න පටන් ගන්න' කියන පණිවිඩය දෙනව හැමතැනටම. එය ආරම්භ වෙන්නේ බොරැල්ල අවට ද්‍රවිඩ සහෝදරවරුන්ගේ ව්‍යාපාරවලට පහර දීලා. එය රට පුරාම පැතිර යන්න පටන් ගන්නවා. ජූලි 25, 26 කියන්නේ තීරණාත්මක විදිහට ගෙවිලා ගියපු දවස් දෙකක්. ඡන්ද හිමි නාම ලේඛනය අරගෙන තමයි ගෙවල්වලට ගිහිල්ලා මේ පහරදීම් කරන්නේ.

25 වෙනිදා බන්ධනාගාරයේ රඳවලා හිටපු දමිළ සහෝදරවරු 37 දෙනෙක් ඝාතනය කරනවා. 28වැනිදා බන්ධනාගාරයේ සියලු ආරක්ෂාවන් මැද හිටපු දමිළ සහෝදරවරු 15 දෙනෙක් ඝාතනය කරනවා. ලෝකයට වුණත් ලංකාව දිහා බලන කොට ජූලි මාසය කියන්නේ කළු ජූලියක්. 27 වෙනිදා තමයි ජේ.ආර් ජයවර්ධන ජනාධිපති බැටළු හම් පොරවාගෙන ජාතිය අමතා කතා කරන්නේ. ඒ වගේම මේ සිදුවීම් පාදක කරගෙන ජ.වි.පෙ. ඇතුළු වාමාංශික පක්ෂ 03ක් තහනම් කරනවා. ඔවුන්ගේ බල වුවමනාව වෙනුවෙන් ජාතිවාදී වර්ගවාදී කෝලාහලයක් ඇති කරලා ඔවුන්ට අවශ්‍ය වෙලා තිබ්බ යටි අරමුණක් තමයි ඔවුන් මේ මගින් ඉෂ්ට කරගන්නේ.

එවැනි අඳුරු යුගයක් පහු කරලා අපි මේ වෙනකොට ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා. රටක් වශයෙන් අපි දැන් ඉන්නෙ තවදුරටත් අපිව ජාතීන් වශයෙන්, ආගම් වශයෙන් වෛරය ඇති කරලා බෙදන්න බැහැ කියන එක ඔප්පු කර පෙන්වපු යුගයක. ඒ ජාතිවාදී, ආගම්වාදී මතවාද පරාජය කරලා, ජනතාව ඒ යුගය අවසන් කළා. ඒකට හොඳම උදාහරණය පසුගිය මහ මැතිවරණය. ජාතික ජන බලවේගය උතුරෙත්, නැගෙනහිරත්, බටහිරත්, දකුණෙත් සියලු ජනතාවගේ අනුමැතිය ලබාගනිමින් මේ රටේ ආණ්ඩුකරණය ආරම්භ කළා. ඒක ඉතාම සාධනීය පියවරක්. ඉතිහාසය තුළ ගත්තම දකුණෙන් බිහි වූ දේශපාලන පක්ෂයක් උතුර ජයග්‍රණය කළ පළමු වතාව මේක. දේශපාලන පක්ෂයක් වශයෙන් සහ සමාජවාදී තරුණ සංගමය විදිහට අපි ආරම්භයේ සිටම විශ්වාස කළා යුද්ධය කියන්නේ ජාතික ගැටලුවට පිළිතුරක් නෙවෙයි කියන එක; ජාතික ගැටලුවට එකම විසඳුම ජාතික සමගිය කියන එක.

ඒ අනුව එදා වෛරය අරන් ආව යාල්දේවි දුම්රියෙන් වෛරය වෙනුවට ආදරයත්, කෲරත්වය වෙනුවට මනුෂ්‍යත්වයත්, පොලු මුගුරු වෙනුවට පොතුත්, කඩු කිණිසි වෙනුවට පැළත් අරන් අපි යාපනයට ගියා. ජාතික සමගිය පිළිගන්න ප්‍රගතිශීලි මිනිස්සු එක්ක එකතු වෙලා අපි මේ ගමන ගියේ, ඒ ඉතිහාසය වෙනස් වෙලා ඉවරයි කියන පණිවිඩය අරගෙන. ඒ වගේම අපි දන්නවා මේ ජාතිකත්ව සියල්ල ස්වීකරණය වීම තුළින් පමණයි අපිට ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනංවන්න හැකි වෙන්නේ කියන එක. ඉතින් මේ "සහෝදරත්වයේ දිනය" වෙනුවෙන් සිදුකළ වැඩසටහනෙත් අපේ අරමුණ වුණේ එලෙස මේ සියලු දෙනා අතර ජාතික සමගිය ගොඩනැංවීම. ඒ අනුව අවසානයේ ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැංවීම තමයි අපේ අවසන් අරමුණ.

> අඳුරු යුගයක් පහු කරලා අපි මේ වෙනකොට ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයකට පැමිණ තිබෙනවා. රටක් වශයෙන් අපි දැන් ඉන්නෙ තවදුරටත් අපිව ජාතීන් වශයෙන්, ආගම් වශයෙන් වෛරය ඇති කරලා බෙදන්න බැහැ කියන එක ඔප්පු කර පෙන්වපු යුගයක.

***කළු ජූලිය වගේම යාපනය පුස්තකාලය ගිනි තැබීමත් ඉතිහාසයක කළු පැල්ලම්. මේවාට වගකිව යුත්තේ කවුද?***

අතීතය ගත්තහම 1977 සිට ආරම්භ වුණු ක්‍රියාවලියක ප්‍රතිඵල වශයෙන් 1981 වසරේදී විශාල බේදවාචකයක් සිදුවෙනවා. හයෙන් පහක බලයක් අරන් බලයට පත්වුණු ජේ.ආර් ජයවර්ධන ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට එකුදු මන්ත්‍රීවරයෙක්වත් උතුරෙන් පත් කරගන්න හැකියාව ලැබෙන්නේ නැහැ. මේ නිසා එක්සත් ජාතික පක්ෂ නායකයෝ 1981 ජූනි 04 වැනිදා පැවැත්වීමට නියමිතව තිබූ උතුරේ සංවර්ධන සභා මැතිවරණය කෙසේ හෝ ජයග්‍රහණය කරන්න සැලසුමක් හදනවා.

ඒ සැලසුමට අනුව මැයි 31 වෙනිදාට පෙර දිනයක ආණ්ඩුවේ මැරයෝ, කුරුණෑගල දුම්රිය ස්ථානයෙන් මැතිවරණ රාජකාරී සඳහා රාජ්‍ය නිලධාරින් රැගෙන ගිය යාල් දේවී දුම්රියට නගිනවා. ඒ වගේම ගමන ආරම්භ කරන්න පෙර එවකට මන්ත්‍රී ගාමිණී ජයවික්‍රම පෙරේරා කුරුණෑගල දුම්රිය ස්ථානයේ මයික්‍රොෆෝනය අතට අරගෙන ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරනවා, "මේ යන්නේ ජාතික වීර ගමනක්. අවශ්‍ය උපදෙස් එහිදී ලැබෙයි" කියලා.

මැයි 31 වෙනිදා මැතිවරණ රාජකාරී වෙනුවෙන් හින්දු විද්‍යාලයට රාජ්‍ය නිලධාරීන්ව අරගෙන යනකොට ඔවුන් දකිනවා උතුරේ විවිධ තැන්වල ගිනිදැල් ඇවිලිලා තියෙනවා. යාපනය හින්දු විද්‍යාලයට එදා ආපු ගාමිණී දිසානායක, පෙස්ටස් පෙරේරා, සිරිල් මැතිව් සහ රනිල් වික්‍රමසිංහ කියන එවක රජයේ අමාත්‍යවරුන් රජයේ නිලධාරීන්ට උපදෙස් දෙන්නේ මැතිවරණය උදෑසන දහය වෙද්දී අවසන් කරලා ඡන්ද පෙට්ටිවලට සතාට ලකුණු කරපු ඡන්ද පත්‍රිකා පුරවන්න කියලා. මේක තමයි ඉතිහාසයේ දැවැන්තම ඡන්ද මංකොල්ලය. මේ පිළිබඳව එහි රාජකාරි කටයුතුවලට ගිය අවසන් රාජ්‍ය සේවකයා ප්‍රසිද්ධ ප්‍රකාශයක් පවා කරලා තියෙනවා. එදා තමයි යාපනය පුස්තකාලයට ගිනි තබන්නේ. ආසියාවේ විශාලතම පුස්තකාලය වගේම, උතුරේ ජනතාවගේ හදවත වැනි යාපනය පුස්තකාලය පොත් 97,000ක් සමඟ ගිනිගෙන දැවෙනවා. යාපනය පුස්තකාලයට ගිනි තැබූ දිනයේ මං ඉහත සඳහන් කළ අමාත්‍යවරුන් යාපනයේ සිටි බවට ආගමික නායකයින් තහවුරු කළ බව එස්.ඩී. බණ්ඩාරනායක ජූනි 10 වෙනිදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශයට පත්කරනවා. එය හැන්සාඩ් වාර්තාවල සඳහන් වෙනවා.

කවුරුත් නොසිතූ මොහොතක යාපනය පුස්තකාලය ගොඩනගන්න කැපවුණ, එවකට පුස්තකාලාධිපතිව සිටි ආචාර්ය හයිසින්ත් සිංගරායර් ඩේවිඩ් පියතුමා කවදාවත් නැතුව පුස්තකාලය දෙසින් එන මේ ආගන්තුක දුම් වළාවල් දැකලා ඒ මොහොතේ එහි සිටි පියතුමාට ඇමතුමක් දෙනවා. ඔහු අහනවා, "මොකක්ද මේ දුමක් නැගෙන්නෙ?" කියලා. "පුස්තකාලයට ගිනි තිබ්බා" කියන පිළිතුර එක්ක ඔහු හෘදයාබාධයකින් එතනම මිය යනවා.

මේ සියල්ල දිහා විශ්ලේෂණය කරල බැලුවහම අපිට තේරුම් ගන්න පුළුවන් කවුද මේවට වගකියන්න ඕනෑ

11 වැනි පිටුවට



YES WE CAN

# Youth Club හීතිකාව...

2019 දත්ත වාර්තාවලට අනුව ලංකාවේ වයස 40ට අඩු ජනගහනයෙන් 6.5%ක් ආසන්න වශයෙන් ලක්ෂ පහක් (500,000) පමණ විෂ මත්ද්‍රව්‍ය භාවිතා කරයි. මෙම දත්තවලට අනුව සමස්ත පිරිමි ජනගහනයෙන් 1.2% ක් හා සමස්ත කාන්තා ජනගහනයෙන් 0.018%ක් හෙරොයින් භාවිතා කරයි.

එසේම ලංකාවේ සිරකරුවන්ගෙන් 68.1%ක් (22,200 ක්) තරුණ වයසේ පසුවන සිරකරුවන් වේ. අපේ රට තුළ සිදුවන මිනීමැරුම්වලට සම්බන්ධ වයස් සීමාවන් පිළිබඳ සමස්ත අධ්‍යනයක් සිදුවී නොමැති වුවත්, ගාල්ල දිස්ත්‍රික්කයේ පමණක් සිදු කළ සමීක්ෂණයකින් පෙන්වා දෙන්නේ සිදු වී ඇති මිනීමැරුම්වලට වයස 21-40 අතර වයස් කාණ්ඩයේ සම්බන්ධය 62.5%ක් බවයි. ලංකාවේ මානසික ආබාධ සහිත වයස් කාණ්ඩ නිරීක්ෂණයේදී පෙනීයන්නේ වයස 10-24 කාණ්ඩය වැඩිම ආබාධ පෙන්නුම් කරන කාණ්ඩය බවයි.

එසේම ලංකාවේ ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනයෙන් වයස 15-39 අතර තරුණයින්ගෙන් ජාතික ආර්ථිකයට දායකවන්නේ 38.2%ක් පමණි.

ඉහත දත්ත අධ්‍යනයෙදී පෙනී යන්නේ අපේ රටේ තරුණ ජනගහනයේ බේදවාචකයයි. වසර 76ක් පාලනය කළ පාලකයින්, රටේ ආර්ථිකයට එකතු කර ගැනීමට නොහැකිව අතරමන් කර දැමූ තරුණයා සමාජ බේදවාචකයේ ගොදුරු බවට පත් විය. මෙයට දායක වූ පාලකයෝ, තරුණයින්ගෙ අභිවෘද්ධිය වෙනුවෙන් ගොඩනැගුණු ආයතන, අමාත්‍යාංශ තම දේශපාලන පැවැත්ම වෙනුවෙන් භාවිතා කළහ. දක්ෂ, උගත් ලෝකය ජයගත හැකි ස්වාධීන පෞරුෂයක් සහිත තරුණයෙක් ගොඩනගනවා වෙනුවට, පාලකයින්ගේ පැවැත්මට හිතකර තරුණ සමාජයක් ගොඩනැගීම වෙනුවෙන් මෙම බොහෝ ආයතන මෙහෙය වනු ලැබිණි.

පසුගි රනිල් වික්‍රමසිංහ පාලන කාලය තුළ ජාතික තරුණ සේවා සභාව තම වුවමනාවන් වෙනුවෙන් භාවිතා වී ඇති ආකාරය කෝප් කමිටුව හමුවේ මේ වන විටත් හෙළිදරව් වී ඇත. තරුණ අභිවෘද්ධිය වෙනුවෙන් වෙන් කළ මහජන ධනය තම මැතිවරණ ව්‍යාපාරය වෙනුවෙන් භාවිත කළ ආකාරය හෙළිදරව් විය.

ඊට අනුවම, ජාතික තරුණ සේවා සභාව ග්‍රාමීය තරුණයාගේ අභිවෘද්ධිය වෙනුවෙන් මෙහෙයවා නොමැති බව ප්‍රසිද්ධ සත්‍යයයි. තරුණ සේවා සභාව සතු ප්‍රාදේශීය දේපළවල, ගොඩනැගිලිවල, ගොවිපළවල හා ආයතනවල වර්තමාන තත්ත්වය නිරීක්ෂණය කිරීමේදී ඒ බව මනාවට පසක් වෙයි.

යෞවන සමාජ බලමණ්ඩල ක්‍රියාකාරීත්වයේ ඉතිහාසයත් ඊට නොදෙවෙනිය. බොහෝ ග්‍රාමසේවා වසම්වල යෞවන සමාජ පිහිටුවා නොතිබුණි. ප්‍රාදේශීය මණ්ඩල කොලකෑලි වලට සීමා වී තිබුණි. එය පැරණි පාලකයින්ගේ පැවැත්මට උචිතය. නමුත් තරුණයාට අනුචිතය.

මෙවැනි තත්වයක් තුළ අද දවසේ youth club ගොඩනැගීම සාර්ථකව ක්‍රියාත්මක වෙමින්, ඒ මගින් එම ආයතන නිවැරැදි තරුණ නායකත්වයන් යටතේ තරුණ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ මගින් අනාගත ලෝකය විනිවිද දකින නිවහල්, නවීන තරුණයෙක් ගොඩනැගීම කිසිවෙකුටත් වැළැක්විය නොහැකි වනු ඇත.

ඒ බව දත් විනාශකාරී පැරණි පාලකයින්ට youth club හීතිකාවක් බවට පත්ව ඇත. එම හීතිකාවෙන් මිදීමට විවිධ බාධා කිරීම්, ඊනියා අවලාද හා අසාර්ථක කඩාප්පල්කාරී ක්‍රියා සිදුකරමින් ඇත. මෙම ප්‍රතිගාමීත්වයට එරෙහි මතවාදයක් ගොඩනැගීමත්, ඊට එරෙහිව තරුණයා සංවිධානය කිරීමත් මේ මොහොතේ අපගේ කාර්යය වනු ඇත.

# සහෝදරත්වය උසට...

අහරක් නොමැතිව සිටි කුසට
දෙපිලක බෙදාදුන් අවි ගැට
නොනිමාව අඩසියවසක සිට
බෙදා වෙන්කර ඇඳි
සිතියමට

හදවත් පුපුරා දමන ලෙසට
මරාදමා ලේ තෙමන
පොළොවට
ආඩි ලිං ඇද වැටී පතුලට
තිබූ රටක් ගොඩගනිමු
කෙලෙසට

මත්ව ජාතිවාදී වදන් වට
සත්‍ය පිපිරී හෙණ හඬට
මුසාවෙන් පිරුවත් කවට
හෙට දවස සොඳුරුය සැමට

එදවස් හොවා පස් යට
මළවුන් මතින් නැගි සිට
උන්ගේ ප්‍රාණය මුදුනට
පුබුදමු සහෝදරත්වය උසට



# සහෝදරත්වය රැගෙන SYU යාපනයට

1983 ජූලි 23 වෙනිදා ලංකා ඉතිහාසයට කළු පැල්ලමක් එකතු කළ දිනයකි. එය එක් රාත්‍රියකින් ඇරඹී තවත් රාත්‍රියකින් අවසන් වූ සිදුවීමක් නොවේ. පටු අභිලාෂයන් වෙනුවෙන් ජාතිවාදය මුදා හැරීම දීර්ඝ කාලීන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වූ අතර, 1981 මැයි 31 දින වෛරය, කෘරත්වය සහ ජාතිවාදය රැගෙන කුරුණෑගල සිට යාපනය දක්වා ගිය යාල්දේවි දුම්රිය එහි එක් සන්ධිස්ථානයකි.

කෙසේ වුවද 2025 සහෝදරත්වය දිනය වෙනුවෙන් පසුගිය 23 වෙනිදා සමාජවාදී තරුණ සංගමය යාල් දේවි දුම්රියෙන් යාපනය වෙත ගියේ වෛරය වෙනුවට ආදරයත්, කෘරත්වය වෙනුවට මනුෂ්‍යත්වයත්, ජාතිවාදය වෙනුවට ජාතික සමගියේ පණිවිඩයත් රැගෙනය.

මෙවර සහෝදරත්වයේ දිනය "එක්ව අපි පියාඹමු" තේමාව යටතේ සිදු කළ අතර, 23 වෙනිදා උදෑසන 6.40ට තරුණ සංගමයේ සහෝදරත්වය කොළඹ කොටුව දුම්රිය ස්ථානයෙන් 'යාල්පානම' බලා පිටත් විය.

කොළඹ සිට යාපනයට යන අතර හමුවන සියලුම දුම්රිය ස්ථානවලදී අපේම සහෝදර සහෝදරියෝ සහෝදරත්වය වෙනුවෙන් පොත් රැගෙන, ආදරයේ පැළ රැගෙන, මනුෂ්‍යත්වය සංකේතවත් වන සිතුවම් රැගෙන දුම්රියට ගොඩවූහ.

උදෑසන 8.33ට කුරුණෑගලට ළඟා වූ දුම්රිය, එම දුම්රිය ස්ථානයේදී පොත්පත් ලබාදීමේ වැඩසටහනක් හා පැළ සිටුවීමේ වැඩසටහනක් සිදු කළහ.

දුම්රිය උදෑසන 10.40 අනුරාධපුරයට ළඟා වන විටද යාපනය බලා යෑමට තරුණ තරුණියන් පැමිණ සිටියේ හිස් අතින් නොව, ආදරය, සහෝදරත්වය රැගෙනය.

පස්වරු 3.00ට යාපනය දුම්රිය ස්ථානයට ළඟාවීමෙන් පසු එම දුම්රිය ස්ථානයට පොත්පත් ලබාදීමේ වැඩසටහනක් එහිදී සිදු කෙරුණි.

එහි සිට යාපනය ට්‍රීමර් ශාලාව වෙත "සහෝදරත්වයේ පාගමන" සිදු වූ අතර, සංස්කෘතික විවිධත්වය විදහා දක්වමින්, සංස්කෘතික උළෙලක් පැවැත්වීම කලා මාධ්‍යයන් ජාතික සමගිය ඇති කිරීම වෙනුවෙන් දැක්වූ දායකත්වය පෙන්නුම් කළ අවස්ථාවක් විය. එසේම "සහෝදරත්වයේ දෑත්" නමින් තවත් සිතුවමක් සජීවීව එහි නිර්මාණය වූයේ පැමිණ සිටි සියලුම දෙනාගේ වර්ණවත් දෑත් වලිනි.

එමෙන් ම 24 වෙනිදා එලුවතිව් දූපතට ගිය ගමන වෙනස්ම අත්දැකීමක් වූ අතර, එහි දී එලුවතිව් දූපතේ පොල් පැළ 200ක් සිටුවීම වෙනුවෙන් පොල් පැල ලබාදීමේ වැඩසටහනක්, එලුවතිව් පාසලේ සංවර්ධන කටයුතු සඳහා සහය දැක්වීමේ වැඩසටහනක් සහ එලුවතිව් ශදමචය කකමඉ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීමක් සිදු කෙරුණි.

මේ කිසිවක් අඩ සියවසකට වැඩි ජාතිවාදය විසින් වපුරන ලද එදිරිවාදීකම් මුළුමනින්ම සිත්වලින් බැහැර කරවීමට සමත් නොවන බව අපි දනිමු. එහෙත් තවදුරටත් ජාතිවාදයට ඉඩ නොතබන පාලනයක් තුළ අපි ශක්තිමත් ආරම්භයක් තබා ඇත්තෙමු. අප සිටවූ පැළ එල දරනු ඇති බව නිසැකය.



















## සියවස් හතරක් පමණ වයස මෝර ආච්චි...



සෙක්ස්පියර් පෘථිවියේ ඇවිද ගිය දා සිට ජීවතුන් අතර සිටින ගැහැනු මෝරෙකු ගැන ඔබ දන්නවාද? මේ පුවත මිත්‍යා කතාවක් ලෙස පෙනුණද එය සැබෑවකි. 1620 දී ග්‍රීන්ලන්ත මුහුදේ උපත ලද ඇයගේ වයස අවුරුදු හාරසියය ඉක්මවයි. එහි තේරුම ටජ්මහල් ඉදිකරන විට ඇය ආර්ටික් සාගරයේ අයිස් යට පිහිනමින් සිටින්නට ඇති බවය. ඇගේ වයස හරියටම තීරණය කළේ කෙසේද? විද්‍යාඥයන් විසින් ඇගේ අක්ෂි පටකවල විකිරණශීලී කාබන් කාල නිර්ණය මගින් ඇයගේ වයස නිර්ණය කර ඇත. මෙම ගැඹුරු මුහුදේ මෝර ආච්චි මෙතෙක් වාර්තා වී ඇති වයස්ගතම පෘෂ්ඨ වංශිකයා බව තහවුරු කරයි.


## දූවිලි අංශු ග්‍රහණය කරන සුදු බුබුළු පටලය...



මෑතකදී දැවැන්ත "සුදු බුබුලකින්" වැසී ගිය ඉදිකිරීම් ස්ථානයක් දැක්වෙන ඡායාරූපයක් සමාජ මාධ්‍ය තුළ සංසරණය වන බව ඔබ දකින්නට ඇත. චීනයේ බීජිංහිදී පරිසර විද්‍යා හා පරිසර අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් යුතුව උසින් මීටර 50ක් සහ වර්ග මීටර් 20,000ක් ආවරණ වන පරිදි සෙමින් පිම්බෙන පටලයක් නිර්මාණය කරනු ලැබ ඇත. මෙම ව්‍යුහයට දූවිලි අංශු 90%ක් දක්වා ග්‍රහණය කර ගත හැකි අතර ඩෙසිබල් හතළිහකින් අඩු ශබ්ද දූෂණය අඩුකර ගත හැකිය.

මෙම පටලය නාගරික පසුබිමක මෙතෙක් ඉදිකර ඇති විශාලතම පටල ඉදිකිරීම වන අතර එය ගෝලාකාර හැඩයකින් යුක්ත වී ඇත්තේ අවට නේවාසික අසල්වැසි ප්‍රදේශ දූවිල්ලෙන් හා ශබ්දයෙන් ආරක්ෂා කර ගැනීම සඳහාය. 2030 වන විට තිරසාර අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙය හොඳ ආරම්භයක් වනු ඇති බව එරට විද්‍යාඥයින්ගේ අදහසයි.

## වේගවත්ම තාරකාව S4714...



අප සිටිනා මන්දාකිණියට ඇහි පිල්ලමක් ගැසීමටත් වඩා අඩු වේගයකින් ගමන් ගන්නා තාරකාවක් ඇති බව ඔබ දන්නවාද? S4714 යනු අප සිටිනා මන්දාකිණියේ මධ්‍යයේ ඇති වේගවත්ම තාරකාවයි. එය ක්ෂීරපථයේ ඇති දැවැන්ත කළු කුහරය වන සැජිටේරියස් Aට ඇදහිය නොහැකි තරම් ආසන්නව කක්ෂගත වී ඇත. මෙම තාරකාව සූර්යයාගේ ස්කන්ධය මෙන් මිලියන හතර ගුණයකින් පමණ බර ඇති දැවැන්තයෙක් වෙයි. එහි උපරිම වේගය තත්පරයට සැතපුම් 15,000කින් (තත්පරයට කි.මී. 240,000කින්) ළඟාවන අතර දළ වශයෙන් තත්පර දාසයකින් පෘථිවියේ සිට සඳ දක්වා ගමන් කිරීමට තරම් වේගවත් වේ.

# වෙනස් කිරීම හා වෙනස් වීම

ලංකාවේ මෙතෙක් පැවති හා තවමත් සමහර ක්ෂේත්‍රවල පවතින ආර්ථික, සමාජ, දේශපාලනික හා සංස්කෘතික ගැටලු පිළිබඳව හැම දෙනාටම ඇත්තේ අසතුටකි; විවේචනයකි. ඒ නිසාම පවතින තත්වය වෙනස් කළ යුතුය යන්න කාගේත් අපේක්ෂාව වේ. සමාජයේ ගැඹුරු වෙනසක් යනු කාගේත් ප්‍රාර්ථනාව වේ. හැම දෙයක්ම වෙනස් විය යුතු යයි බොහෝ දෙනා කියති; ලියති. එහෙත් එම සමාජයම, එම ප්‍රජාවම වෙනසක් කිරීමට යන විටම ඊට එරෙහිව නැගී සිටිති; බාධා කරති.

පුද්ගලයන් මෙන්ම සමාජයක්ද යම් රටාවකට, යම් පුරුදුවලට කාලයක් තිස්සේ පුරුදු වූ විට එම තත්වයන් වෙනස් වීම සලකන්නේ කරදරයක් ලෙසිනි. නැතිනම් තමන්ට හිමි දෙයක් නැතිවේ යයි බියෙනි. ජීවිත කාලයක් පුරා රැවටුනු, දුක් කරදරවලට මුහුණ දුන් සමාජයක් එලෙස සිතීම ගැන පුදුම විය යුතුද නැත. එහෙත් මේ සියලු බාධක තිබියෙදී සමාජය වෙනස් කළ යුතුය; වෙනස් විය යුතුය.

සමාජයක් වෙනස් කිරීමේදී ඊට නායකත්වය දෙන මගපෙන්වන බලවේග වටහාගත යුතු කරුණු කිහිපයක් තිබේ. වෙනස්කම් කිරීමේ හොඳම ක්‍රමය බලය යෙදීම නොව දැනුවත් කිරීම හා අවබෝධය මගින් කටයුතු කිරීම යන්න ඉන් එකකි. එසේම වෙනස්කම් ක්‍රමානුකූලව කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය කාලය ගත යුතුය යන්න තවත් එකකි. එසේම සමහර අත්‍යවශ්‍ය වෙනස්කම් එය නිවැරදි නම් විරෝධයන් හා විවේචනයන් නොසලකා කළ යුතුය. මන්ද අලුත් වෙනස තහවුරු වන විට විරෝධය දැක්වූවන් පවා පසුව එය වැළඳ ගන්නා බැවිනි. මෙහි වඩා වැදගත්ම දෙය වන්නේ වෙනස් කිරීම සඳහා තමන් වෙනස් වීමය. තමන් හැර අන් සියල්ල වෙනස් විය යුතු යයි සිතීම ප්‍රතිඵල නැති හාස්‍යජනක සිතිවිල්ලකි.

සමාජයක වෙනස්වීම් සිදුකරද්දී මෙන්ම, සමාජය නව තත්වය තුළ ඉදිරියට මෙහෙයවද්දී සිදුවිය හැකි විශාලම ගැටලුව වන්නේ පැරණි යල් පැනගිය සටන් පාඨවල දිගටම එල්ලී සිටීමය. සමාජයේ ඕනෑම ගැටලුවක් පිළිබඳව දේශපාලන ව්‍යාපාරයක්, දේශපාලන බලවේගයක් දරන මතය එය අදාළ මොහොතේ පැවති විෂය මූලික තත්වයන්ට සාපේක්ෂ වේ. ඒවා නිරපේක්ෂ නැත. තත්වයන් වෙනස්වූ විට ස්ථාවරයන්ද වෙනස් කළ යුතුය. සටන් පාඨ වෙනස් කළ යුතුය. ගැටලුව වන්නේ තත්වයන් වෙනස් නොවී තිබියෙදී පෞද්ගලි වාසි සඳහා ස්ථාවර වෙනස් කිරීමය. එය අවස්ථාවාදය වේ. එහෙත් වෙනස් වූ සමාජ ආර්ථික කොන්දේසිවලට අනුව යම් ප්‍රශ්නයක් සඳහා වූ ස්ථාවරය, විසඳුම වෙනස් කිරීම සමාජයේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ.





"එබඳු අලුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩු නම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැළැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය සමාජවාදීහු නොවෙති."

**ලෙනින්**

**තෝරාගත් කෘති, 10 වෙළුම, 129 පිටුව**

මෙය උදාහරණවලින් තේරුම් ගන්නේ නම්, ප්‍රතිගාමීන් අත, දූෂිත පවුල් කණ්ඩායම් අත රටක බලය පවතින විට අපේ ප්‍රවේශය වන්නේ එම බලය දුර්වල කිරීමේ දිශාවටය. එහෙත් බලය පවතින්නේ ප්‍රගතිශීලී වාමාංශික බලවේග අත නම්, එවිට අපේ ප්‍රවේශය විය යුත්තේ එම බලය සවිමත් කිරීමේ දිශාවටය. නැතිව කලින් සිටි ස්ථාවරයේ සිට බලය දුර්වල කිරීමේ දිශාවට නොවේ. රාජ්‍යයක් තුළ වංචාව, දූෂණය සිදුවන්නේ නම්, ඒවා පාලනය කිරීමට නීති හා ක්‍රියාමාර්ග අවශ්‍ය වන අතර, වංචා දූෂණ සිදු නොකරන රාජ්‍යයක් සඳහා එවැන්නක් ඒ මට්ටමෙන් අවශ්‍ය වන්නේ නැත. මන්ද එවිට එම නීති හා ක්‍රියාමාර්ග වේගවත් සංවර්ධන ක්‍රියාවලියකට බාධාවන හෙයිනි. අධ්‍යාපනය, රාජ්‍ය සේවය, ආර්ථිකය, සංස්කෘතිය ආදී සියලු ක්ෂේත්‍රවලට මෙය අදාළය.

රුසියාවේ ධනේශ්වර විප්ලවය සිදු නොවී පැවැති තත්වයක් තුළ 1905 දී රුසියාවේ බලය ගැනීම සඳහා ලෙනින් සකස් කළ වැඩපිළිවෙළ 1917 පෙබරවාරි ධනේශ්වර විප්ලවය සිදුවීමත් සමග වෙනස් කළේය. ඒ වෙනුවට අලුත් වැඩපිළිවෙළක් අලුත් උපායමාර්ග සකස් කළේය. ඒ තත්වයන් වෙනස් වූ විට නව තත්වයනට පැරණි ස්ථාවර නොගැලපෙන නිසාය. එසේ තිබියෙදී පැරණි වැඩපිළිවෙළ මතම එල්බ සිටි ක්‍රියාධරයන්ට 'අප්‍රේල් තිසීසය' නම් පොත් පිංච මගින් ලෙනින් මෙසේ පැවසීය. "එහෙත් අපි අපටම බිය වී සිටිමු. අපගේ 'ආදරණීය පැරණි' කුණු තැවරුන කමිස ඉවත දැමීමට අපි පසුබට වෙමුද? නමුත් කිලිටු කමිසය ඉවතලා පිරිසිදු ඇඳුම් ඇඳගැනීමට කාලය පැමිණ තිබේ" යනුවෙනි.

මෙහිදී දේශපාලනයේ උපාය උපක්‍රම වෙනස් කර ගැනීමට අමතරව තම තමන්ද නව තත්වයන්ට අනුව වෙනස් වීම, වෙනස් ලෙස සිතීම සමාජ පරිවර්තනයකදී අත්‍යවශ්‍ය වේ.

දේශපාලනයේ ප්‍රතිපත්තීන් හා ස්ථාවරයන් තත්වයන්ට අනුව වෙනස් කරන බවට වන හොඳම උදාහරණය මේ දිනවල ඇමෙරිකා එක්සත් ජනපදයේ ට්‍රම්ප් පාලනය ගන්නා ක්‍රියාමර්ගවලින්ම අපට තේරුම් ගත හැක. 1975 කාලයේ එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර රටවල්, අධිරාජ්‍යවාදී බලවේග නව ලිබරල්වාදය හඳුන්වා දී එය පිළිගන්නා ලෙස ලොවටම බල කළ හැටි අපට මතකය. එහිදී ඔවුන් ලෝක බැංකුව, ලෝක වෙළඳ සංවිධානය වැනි සංවිධානද උපයෝගී කරගෙන විවිධ වෙළඳ ගිවිසුම් ඇතිකර ගනිමින් ලොවට ප්‍රකාශ කළේ නිර්බාධිත වෙළඳපොළක් නිර්මාණය කළ යුතුය යන්නය. නිදහස් වෙළඳපොළ ආර්ථිකය ලෙසද මෙය හැඳින්විය. වෙළඳාමට කිසිදු රටක් බාධා නොකළ යුතු බවත් වෙළඳපොළට නිදහසේ සැරිසැරීමට ඉඩ දිය යුතු බවත් එකල ඔවුන් වෙනුවෙන් පෙනී සිටි ආර්ථික විද්‍යාඥයන්ගේද මතය විය. අවසානයේ ලෝකයම තීරුබදු රහිත තනි වෙළඳපොළක් කිරීමේ සංකල්පය දක්වාම ඔවුහු අදහස් ඉදිරිපත් කළෝය.

එහෙත් දැන් බිඳවැටෙමින් තිබෙන එක්සත් ජනපද ආර්ථික ආධිපත්‍යය හමුවේ ට්‍රම්ප් පාලනය ඉහත ප්‍රතිපත්තිය මුළුමනින්ම ඔළුවෙන් සිටුවා තිබේ. එහි සම්පූර්ණ ප්‍රතිවිරෝධයට ගොස් තිබේ. දැන් එක්සත් ජනපදය හා ලෝකයේ රටවල් අතර වන වෙළඳාමේ අසමතුලිත බව වෙනස්කිරීම සඳහා සියලු රටවලට විශාල තීරුබදු පනවා ඇත. තීරුබදු රහිත නිදහස් වෙළඳපොළක් වෙනුවෙන් පෙනී සිටි එක්සත් ජනපදයම තම රටේ වෙළඳපොළ රැකගැනීම සඳහා දරාගත නොහැකි තරම් තීරු බදු පැනවීමට ක්‍රියාකිරීම තුළින් ඔවුන්ගේ සියලු සටන් පාඨ තත්වයන්ට සාපේක්ෂ බව පෙන්වා ඇත. ලෝකය ගමන් කරන්නේ එසේය. එබැවින් හැම විටම වෙනස් වන තත්වයන් සැලකිල්ලට ගෙන ඊට අනුව වෙනස් වීමත්, නව වෙනසක් සඳහා තමන් වෙනස් වීමත් ඉතා වැදගත්ය.

ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම බරපතළ වෙනස්කම් සිදුවිය යුතුය. රාජ්‍ය සේවයේ අරමුණු හා ක්‍රියාකාරිත්වය වෙනස් විය යුතුය. මහජනයා සඳහා සේවය කරන ආයතනවල ආකල්ප වෙනස් විය යුතුය. දැඩි මූල්‍ය විනයක් ඇති කළ යුතුය. මහපාරේ විනය (වාහන හා මගීන්) ඇති කළ යුතුය. ජනතාව සිතන ආකාරයන් වෙනස් කළ යුතුය. අපේ ඉඩම් ප්‍රතිපත්ති, නිවාස ගොඩනැගීම ආදිය විධිමත් විය යුතුය. පරිසරයට හා මිනිසා පිළිබඳව ඇති ආකල්ප වෙනස් විය යුතුය. හුදකලා ජයග්‍රහණ වෙනුවට සාමූහිකත්වය නිර්මාණය විය යුතුය. සමාජය සංස්කෘතික වශයෙන් වෙනස් විය යුතුය; වෙනස් කළ යුතුය. මෙහිදී තමන් සිටිනා තැන හැර අනෙක් තැන් වෙනස් විය යුතු යැයි යන චින්තනය සමාජ සංවර්ධනයට විශාල බාධාවකි. එබැවින් සමාජය වෙනස් කිරීම සඳහා අප වෙනස් විය යුතුය. ලෙනින් වරක් කී පරිදි "වැනෙන්නන්ට සහාය වීමට අවශ්‍ය නම් පළමුව ඔබ නොවැනී සිටිය යුතුය"

**ලංකාවේ සෑම ක්ෂේත්‍රයකම බරපතළ වෙනස්කම් සිදුවිය යුතුය. රාජ්‍ය සේවයේ අරමුණු හා ක්‍රියාකාරිත්වය වෙනස් විය යුතුය. මහජනයා සඳහා සේවය කරන ආයතනවල ආකල්ප වෙනස් විය යුතුය. දැඩි මූල්‍ය විනයක් ඇති කළ යුතුය. මහපාරේ විනය (වාහන හා මගීන්) ඇති කළ යුතුය. ජනතාව සිතන ආකාරයන් වෙනස් කළ යුතුය. අපේ ඉඩම් ප්‍රතිපත්ති, නිවාස ගොඩනැගීම ආදිය විධිමත් විය යුතුය. පරිසරයට හා මිනිසා පිළිබඳව ඇති ආකල්ප වෙනස් විය යුතුය. හුදකලා ජයග්‍රහණ වෙනුවට සාමූහිකත්වය නිර්මාණය විය යුතුය.**

# අග්නිදිග ආසියාව උණුසුම් කළ තායිලන්ත - කාම්බෝජ දේශසීමා අර්බුදය



දේශසීමා ගැටලු පදනම් කරගනිමින් තායිලන්තය සහ කාම්බෝජය අතර දශක ගණනාවක් තිස්සේ මතභේදයක් උද්ගතව පවතී. මෙම තත්වය වරින්වර දෙරට අතර යුද ගැටුම් ඇතිවීමට හේතු වූ අතර එහි ආසන්නම සිදුවීම පසුගිය සති කිහිපය තුළ වාර්තා විය. පසුගිය මැයි 28 දින දේශසීමා ආසන්නයේදී කාම්බෝජ හමුදා නිලධාරියෙකු ඝාතනය වීමත් සමග දෙරට අතර යුද නොසන්සුන්තාවය වර්ධනය වූ අතර දෙපාර්ශවයම යුද තත්වයක් සඳහා සූදානම් වනු දක්නට ලැබිණි. ජූලි 23 දෙපාර්ශවය අතර වෙඩි හුවමාරුව ඇරඹුන අතර එය ප්‍රථමයෙන් ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද යන්න පිළිබඳව දෙපාර්ශවයම තම විරුද්ධවාදියාට චෝදනා කරමින් සිටියි.

මෙම රටවල් දෙක අතර පවතින දේශසීමා අර්බුදය යටත්විජිත යුගය අවසන් වූ අවධියේ පටන් පැවත එන්නකි. වර්තමාන කාම්බෝජය, වියට්නාමය සහ ලාඕසය යටත්විජිත සමයේ ප්‍රංශයට යටත්ව පොදුවේ ඉන්දු-චීනය යන නාමයෙන් හැඳින්විණි. එවකට සියම් දේශය (වර්තමාන තායිලන්තය) අත්පත් කරගැනීමට ප්‍රංශය විසින් උත්සාහ කර තිබුණද එය සාර්ථක වී නොතිබිණි. 1907 දී ප්‍රංශය විසින් ඉන්දු-චීනයට අයත් භූමි ප්‍රදේශ වෙන්කරමින් සිතියමක් සකස් කරන ලදී. එහෙත් එම සිතියම සකස් කිරීමේදී ප්‍රංශය විසින් තායිලන්තයට අයත් භූමියෙන් කොටසක් කාම්බෝජයට අයත් ලෙස නම් කර ඇතැයි තායිලන්තය විසින් එවකට පටන්ම චෝදනා කරමින් සිටියි. කෙසේ නමුත් 1953 නොවැම්බර් මස 09 දින ප්‍රංශය විසින් කාම්බෝජයට නිදහස ලබාදීමත් සමග කාම්බෝජයේ දේශසීමා සහිත සිතියම සකස් වූයේද ප්‍රංශය විසින් 1907 දී නිර්මාණය කරන ලද සිතියම පදනම් කරගනිමිනි.

එම සිතියම අනුව කලාපයේ භූගෝලීය වශයෙන් වැදගත්කමක් උසුලන 'ඩන්ග්‍රෙක්' කඳුවැටිය ආශ්‍රිත භූමිය කාම්බෝජයට අයත් වේ. එමෙන්ම යුනෙස්කොව විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇති 'ප්‍රී විහීර්' කෝවිලද ඉහත සඳහන් භූමියේ ඉදිකර ඇති අතර එයද කාම්බෝජයට අයත් වේ. කලාපයේ යුද-දේශපාලන වැදගත්කම අතින් කඳුවැටිය වැදගත් වූවද දෙරටේ නායකයින්, පවතින දේශසීමා ගැටුමට ජනතා සහභාගිත්වය ලබාගැනීම සඳහා වැඩි වශයෙන් භාවිතා කරන්නේ මෙම කෝවිලේ හිමිකාරීත්වය සම්බන්ධ ගැටලුවයි. මීට අමතරව ඩන්ග්‍රෙක් කඳුවැටියේ බටහිර ප්‍රදේශයේ පිහිටි 'ටා මොආන් තෝම්' කෝවිලේ හිමිකාරිත්වය සම්බන්ධ ගැටලුවද දේශසීමා අර්බුදය අවුළුවාලීම සඳහා යම් පමණකින් හේතු වී ඇත. ක්‍රි.ව. 8-14 අවධියේ කාම්බෝජය පදනම් කරගනිමින් අග්නිදිග ආසියානු කලාපයේ ගොඩනැගුණු 'ඛ්මෙර්' නම් හින්දු අධිරාජ්‍යය පැවති සමයේ මෙම කෝවිල් දෙක නිර්මාණය කර ඇත. වර්තමාන කාම්බෝජය, තායිලන්තය, ලාඕසය අයත් සම්පූර්ණ භූමිය සහ වියට්නාමය, මියන්මාරය, දකුණු චීනයට අයත් භූමි ප්‍රදේශ ද 'ඛ්මෙර්' අධිරාජ්‍යයට අයත් විය.

මෙහිදී වැඩිවශයෙන් කතාබහට ලක්වන 'ප්‍රී විහීර්' කෝවිලේ හිමිකාරීත්වය පිළිබඳව 1962දී ජාත්‍යන්තර අධිකරණය විසින් තීන්දුවක් ලබාදෙමින් ප්‍රකාශ කර ඇත්තේ එය කාම්බෝජයට අයත් බවයි. 2013 වසරේදී ජාත්‍යන්තර අධිකරණය විසින් ඉහත තීන්දුව නැවත වතාවක් තහවුරු කරමින් කියාසිටියේ ඒ ආශ්‍රිත ප්‍රදේශවල සිටින තායිලන්ත හමුදා සෙබළුන් වහාම ප්‍රදේශයෙන් ඉවත්විය යුතු බවටයි. ජාත්‍යන්තර අධිකරණය විසින් එවැනි තීන්දු ලබා දී තිබියේදී පවා එම කලාපයේ පවතින යුදමය වටපිටාව අවසන් නොවූයේ දෙරටේම පවතින ධනේශ්වර ජාතිකවාදී දේශපාලන වුවමනා නිසා බව පෙනී යයි.

එම ජාතිකවාදී ධනේශ්වර දේශපාලන පක්ෂ සිය බලය ලබාගැනීමේ වුවමනා සහ දේශපාලන සටන්පාඨ සඳහා දිගින් දිගටම දෙරට අතර පවතින දේශසීමා අර්බුදය භාවිතා කරමින් සිටියි. එය කෙතරම්ද යත් තායිලන්ත අගමැති ලෙස කටයුතු කළ පේටොංග්ටාර්න් ශිනවත්‍රා හට පසුගිය ජූලි මාසයේ සිය ධුරය අත්හැරීමට සිදුවූයේ කාම්බෝජයේ ජනාධිපතිවරයා සමග සිදු කළ දුරකතන සංවාදයක හඬපටයක් සමාජමාධ්‍ය වෙත නිකුත්වීමත් සමගිනි. ඇය කාම්බෝජ ජනාධිපතිවරයාට 'මාමා' ලෙස ආමන්ත්‍රණය කළ බවටත්, දෙරට අතර දේශසීමා ගැටලුව සම්බන්ධ තායිලන්ත ස්ථාවරයන් පාවා දී ඇති බවටත් ඇයට චෝදනා එල්ල විය.

තායිලන්තයේ පවතින වංචා, දූෂණ අබිබවමින් 'කාම්බෝජ ආක්‍රමණිකයාගෙන් මව්බිම නිදහස් කරගැනීම' යන සටන්පාඨය එරට තුළ පෙරටවිත් ඇත. එමෙන්ම එරට පාලනයට සිදුව ඇති මිලිටරි මැදිහත්වීම් සාධාරණීකරණය කරගැනීමටත්, අධික ආරක්ෂක වියදම් සාධාරණීකරණය කරගැනීමටත් මෙම ගැටලුව භාවිත වෙමින් තිබේ. එසේම එරට මාධ්‍ය සහ සමාජ මාධ්‍ය තුළ කාම්බෝජයට එරෙහි ජාතිවාදී මතවාදයන්ද ගොඩනැගෙමින් ඇත.

1998 සිට වසර 24ක් කාම්බෝජයේ අගමැතිවරයාව සිටි 'හුන් සෙන්'ගේ පුත්‍රයා වූ 'හුන් මනෙට්' 2023 දී අගමැතිවරයා ලෙස පත්විය. එසේ පත්වූයේද එරට ප්‍රධානම තනතුර වූ සෙනෙට් සභාවේ සභාපති (ජනාධිපති) ලෙස හුන් සෙන් සිටින අතරතුරය. එරට තුළද පසුගිය කාලයේ මතුවෙමින් පවතින ආර්ථික කඩාවැටීම පසෙක දමමින් (පැරණි) 'ඛ්මෙර්' රාජ්‍යයේ ආරක්ෂකයා ලෙස නව අගමැතිවරයා අභිෂේක ගන්වමින් ඇත. එසේම ඊට එරෙහිව හඬනගන විරුද්ධ පක්ෂ සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් තායිලන්ත හිතවාදීන් ලෙස සහ රට පාවාදෙන්නන් ලෙස නාමකරණය කෙරෙමින් ඇත. එසේම යටත්විජිත සමයේදී පැරණි 'ඛ්මෙර්' අධිරාජ්‍යයට අයත් භූමිය තමන්ට අහිමි වූ බවටත්, තායිලන්තය විසින් එම භූමිභාගයන් අත්පත් කරගෙන ඇති බවටත්, පැරණි රාජ්‍යය නැවත ගොඩනැගිය යුතු බවටත් රාජ්‍ය මාධ්‍ය විසින් මත වපුරමින් සිටියි.

ජාත්‍යන්තර දේශපාලනයේදී තායිලන්තය එක්සත් ජනපද හිතවාදී වීමත්, කාම්බෝජය චීන හිතවාදී වීමත් විසින් මෙම අර්බුදය තවදුරටත් තීව්‍ර කර ඇත. කෙසේ නමුත් මෙම යුදමය වාතාවරණය අවසන් කිරීම සඳහා තුන්වන පාර්ශවයක් ලෙස තමන් මැදිහත් වීමට සූදානම් බවත්, කලාපීය ස්ථාවරත්වය වෙනුවෙන් තමන් කැපවන බවත් චීනය පවසා ඇත. ඒ අනුව දෙරටේ නායකයින් ෂැංහයිවලදී සාම සාකච්ඡා පැවැත්වූ අතර සටන් විරාමයක් සඳහා එකඟතා පළ කර තිබිණි. එමෙන්ම එක්සත් ජනපදය විසින්ද දෙරට අතර යුද ගැටුම් වහා නතර කළ යුතු බවට ප්‍රකාශ නිකුත් කර තිබිණි. එසේම දෙරටම ජාත්‍යන්තර නීතියට ගරු කළ යුතු බව යුරෝපා සංගමය විසින් අවධාරණය කර තිබිණි. එමෙන්ම 'ආසියාන්' සංවිධානය ලෙස සහ විශේෂයෙන් වර්තමානයේ එහි සභාපතිත්වය දරන මැලේසියාව විසින් පසුගියදා ඇති වූ යුදමය තත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රියාකාරී මැදිහත්වීමක් සිදුකර ඇත. සටන් විරාමයක් සඳහා මූලික එකඟතා නිර්මාණය වූයේද මෙම මැදිහත්වීම තුළිනි.

පසුගිය මාසයේ යුද ගැටුම් තුළ සිවිල් වැසින් 13 දෙනෙක්ද ඇතුලත්ව පුද්ගලයින් 19ක් ඝාතනයට ලක්ව ඇති අතර 65ක් පමන තුවාල ලබා ඇත. කාම්බෝජයේ සිවිල් වැසියන් 8ක් සමග 13 දෙනෙකු ඝාතනයට ලක්ව ඇත. සොල්දාදුවන් 20ක් පමණ සමග සමස්තය 70ක් පමණ තුවාල ලබා ඇත. දෙරටේම සිවිල් වැසියන් 260,000ත් 300,000ත් අතර ප්‍රමාණයක් අවතැන් වී ඇති බවටද වාර්තා පළ වේ. ඉන් වැඩි ප්‍රමාණයක් තායිලන්ත වැසියන් බව විශ්වාස කෙරේ. ලෝක උරුමයක් වූ 'ප්‍රී විහීර්' කෝවිලටද ප්‍රහාර හේතුවෙන් හානි සිදුව ඇතැයි පැවසේ. දේශසිමාව ආසන්නයේ පවතින තායිලන්ත ප්‍රදේශ සඳහා යුද නීතිය පැනවීම හේතුවෙන් පාසල් 850ක් පමණ වසාදමන ලදී. යුද ගැටුම් වර්ධනය වූ දින 5 තුළ පමණක් තායිලන්තයට එක්සත් ජනපද ඩොලර් මිලියන 300ක පමණ හානියක් සිදුව ඇතැයි ගණන්බලා ඇත. එමෙන්ම තායිලන්තයේ රැකියාවල නිරතව සිටි කාම්බෝජ ජාතිකයින් 250,000කට පමණ සිය රැකියා අහිමිව නැවත මව්රටට පැමිණීමට සිදුව ඇත.

මේ වන විට දෙපාර්ශවයම සටන් විරාමයක් සඳහා එකඟ වී ඇතත් සිය ප්‍රතිවාදීන් එම එකඟතා උල්ලංඝනය කරමින් සිටින බවට එනිනෙකාට චෝදනා කරගනිමින් සිටිති. දින කිහිපයකට වුවද යුද තත්වය වර්ධනය වීම හමුවේ දෙරටේම ජාතිකවාදී ව්‍යාපාර තවදුරටත් ශක්තිමත්ව ඇත. එම ශක්තිමත් වීම සහ දෙරටේම ප්‍රධාන දේශපාලන ව්‍යාපාරයන්ගේ වැඩපිළිවෙල සලකා බැලූ විට, මේ වන විට ගොඩනගාගෙන ඇති සටන් විරාමය ස්ථිර සාමයක් දක්වා ගමන් කරනු ඇතැයි තවමත් විශ්වාස කළ නොහැක.

## කොංගෝ - රුවන්ඩා සාම ගිවිසුම් ඉදිරියට



කොංගෝව සහ රුවන්ඩාව අතර දශක ගණනාවක් මුළුල්ලේ ඉදිරියට පැමිණි ගැටුම්කාරී තත්වය සමථයකට පත්කරමින් සාම ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත. කටාර් සහ එක්සත් ජනපදය මේ සඳහා මැදිහත් වූ අතර පසුගිය ජූනි 27වැනි දින වොෂිංටනයේදී මෙම ගිවිසුම් අත්සන් කර ඇත. ඒ සඳහා දෙරටේ විදේශ අමාත්‍යවරුන් සම්බන්ධ වී ඇත.

ඒ අනුව දින 90ක් තුළ රුවන්ඩා හමුදා කොංගෝ භූමියෙන් ඉවත්වීමට එකඟතාවය පළ කර ඇත. එමෙන්ම රුවන්ඩාවේ M23 සහ කොංගෝවේ ඍබඍ සන්නද්ධ කණ්ඩායම් සඳහා සහය නොදීමට දෙරටම එකඟ වී ඇත. එසේම මෙම ගිවිසුම නිසා කලාපයේ ඛනිජ සම්පත් සඳහා නිදහස් ප්‍රවේශයක් එක්සත් ජනපදයට හිමිව ඇත.

## ඕස්ට්‍රේලියාව - පලස්තීනය රාජ්‍යයක් ලෙස පිළිගෙන



පලස්තීනය ස්වාධීන රාජ්‍යයක් ලෙස පිළිගැනීමට ඕස්ට්‍රේලියාව සූදානම් බව එරට විදේශ අමාත්‍ය බෙනී වොංග් පවසා ඇත. ඊශ්‍රායල-පලස්තීන යුද්ධය නිමා කළ හැක්කේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් යෝජනා කළ ද්වී රාජ්‍ය සංකල්පය මගින් බවද ඔස්ට්‍රේලියාව වැඩිදුරටත් අවධාරණය කර ඇත. පසුගියදා ඊශ්‍රායල ප්‍රහාර හේතුවෙන් පලස්තීනයේ සහන සේවා කටයුතුවල නිරත වූ ඕස්ට්‍රේලියනු ජාතික කාන්තාවක් ඝාතනය වූ අතර එහි වගකීම ඊශ්‍රායලය බාරගත යුතු බවද ඕස්ට්‍රේලියාව විසින් පවසා ඇත.

එසේම පලස්තීනයේ හමාස් සංවිධානය නිරායුද කළ යුතු බවටත්, මැතිවරණ පැවැත්විය යුතු බවටත්, ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු බවටත්, ඊශ්‍රායල ප්‍රාණ ඇපකරුවන් මුදාහැරිය යුතු බවටත් ඕස්ට්‍රේලියාව අවධාරණය කර ඇත.

## බ්‍රිතාන්‍ය සහ ජර්මනිය - සහයෝගිතා ගිවිසුමකින් බැඳී



පසුගිය ජූලි 17 වන දින බ්‍රිතාන්‍ය සහ ජර්මනිය අතර මිත්‍රත්ව සහ සහයෝගිතා ගිවිසුමක් අත්සන් කරන ලදී. දෙවන ලෝක යුද්ධයෙන් පසු දෙරට අතර මෙවන් ගිවිසුමක් අත්සන් කළ ප්‍රථම අවස්ථාවද මෙය වේ. ලන්ඩනයේදී මෙම ගිවිසුම අත්සන් කෙරුණු අතර ඒ සඳහා බ්‍රිතාන්‍ය අගමැතිවරයා, ජර්මන් චාන්ස්ලර්වරයා සහ දෙරටේ විදේශ ලේකම්වරු එක්ව සිටියහ.

එහිදී ආරක්ෂක ගිවිසුම් මූලික වී ඇති අතර ප්‍රහාරයකදී එක්ව මුහුණදීමට, සහයෝගිතා සන්නද්ධ යාන්ත්‍රණ ඇති කර ගැනීමටත් (මිසයිල, ප්‍රහාරක යානා වැනි), ඩ්‍රෝන වැනි මිලිටරි තාක්ෂණ ක්‍රමවේද හුවමාරු කරගැනීමටත් එකඟතාවයට පැමිණ ඇත. මීට අමතරව දෙරට අතර ආගමන විගමන නීති ලිහිල් කිරීම, බර්ලින් සහ ලන්ඩන් අතර දුම්රිය මාර්ගයක් ඉදිකිරීම වැනි කරුණුද එහි ඇතුළත් වේ.

## කෙන්යාව - අයිතීන් ඉල්ලා තරුණයන් වීදි බැස




ජීවන වියදම් ඉහළ යාමට, පොලිස් කෲරත්වයට, වංචා සහ දූෂණයන්ට එරෙහිව කෙන්යාව පුරා තරුණ උද්ඝෝෂණ රැල්ලක් නිර්මාණය වී ඇත. පසුගිය ජූලි 07 වන දින මෙම තත්වය උත්සන්න වූයේ ගුරුවරයෙක් මෙන්ම බ්ලොග් රචකයෙක් වූ ඇල්බට් ඔමොන්ඩි පොලිස් අත්අඩංගුවේදී ඝාතනය වීමත් සමගයි.

සමාජ මාධ්‍ය මගින් සංවිධානය වූ කෙන්යානු තරුණයින් එදින රට පුරා උද්ඝෝෂණ සිදු කළ අතර එහිදී දියත් වූ මර්දනය හමුවේ 31 දෙනෙක් ඝාතනයට ලක්ව තවත් 107ක් තුවාල ලබා ඇතැයි පැවසේ. තරුණයින් 532ක් පමණ අත්අඩංගුවට ගනු ලැබ ඇත. එරට ජනාධිපතිවරයා මෙය 'ව්‍යවස්ථා විරෝධී නැගීසිටීමක්' ලෙස හඳුන්වා ඇති අතර ඇඳිරි නිතිය පැනවීම, සමාජ මාධ්‍ය සීමා කිරීම, ප්‍රධාන නගරවලට හමුදා යෙදවීම ආදිය සිදු කර ඇති බව වාර්තා වේ.

# ජනතා බදු මුදල් ජනතාවටම

රටක් තම රාජ්‍ය පවත්වාගෙන යාම සඳහා පත් කරගන්නා ආණ්ඩුවට එම රාජ්‍ය මෙහෙයවීම සඳහා ආදායමක් අවශ්‍ය වේ. ඒ සඳහා ඇත්තේ ක්‍රියාමාර්ග දෙකකි. එකක් ආණ්ඩුව ව්‍යාපාර කටයුතුවල නියලී ආදායම් ඉපදවිය යුතුය. අනෙක ජනතාවගෙන් බදු සහ වෙනත් එවැනි ආකාරයේ ගාස්තු අයකිරීම්වලින් ආදායම් උපයාගත යුතුය. මෙය ධනේශ්වර, සමාජවාදී හෝ වෙනත් ඕනෑම ආර්ථික මොඩලයකට පොදු තත්වයකි. වර්තමාන ලෝකයේ සියලුම රාජ්‍යවල පොදු තත්වය වන්නේ ජනතාවගේ බදු මුදල් අයකරගැනීම මත රාජ්‍ය ආදායම නිර්මාණය කර ගැනීමයි.

ශ්‍රී ලංකාවේ රජයේ ආදායම හෙවත් ආණ්ඩුවේ ආදායම දශක ගණනාවක් පුරා පවතින්නේ මුළු ආදායමෙන් 90%ක් පමණ වන බදු ආදායමකින් සහ 10%ක් පමණ වන වෙනත් ආදායම්වලිනි. එම බදු ආදායමෙනුත් 80%ක් පමණ වක්‍ර බදු ආදයමෙනුත් 20%ක් පමණ ඍජු බදු ආදායමෙනුත් ලැබෙයි. වර්තමාන ලෝකයේ රාජ්‍ය, ව්‍යාපාර කටයුතුවලින් ඈත්වන ප්‍රවණතාවයක් තුළ බදු ආදායම ප්‍රධාන ආදායම් මූලාශ්‍රය බවට පත්වී තිබේ. අනෙක් අතට ජනතාව රජයට බදු මුදල් ගෙවන්නේ තමන්ට රජය මගින් ලබාගත යුතු පොදු සේවාවන් ලබාගැනීමේ අරමුණෙනි. මෙම අරමුණ ලෝකයේ බොහෝ ධනේශ්වර රටවල ඒ අයුරින්ම සිදුවෙනවාද යන්න ගැටලුවකි. විශේෂයෙන්ම පසුගාමී ධනේශ්වර රටවල ජනතාවගේ බදු මුදල් ජනතා සුබ සිද්ධිය වෙනුවෙන්ම යෙදවෙන්නේ නැත. එය බොහෝවිට පාලකයාගේ සුබ විහරණය සඳහා වැඩි කොටසකුත් ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් අඩු කොටසකුත් යෙදවෙන ආකාරය බොහෝ රටවල ස්වභාවයයි. ලංකාවේ අප පසුගිය දශක ගණනාවක් පුරා මුහුණ දුන්නේද එවන් තත්ත්වයකටය. පාලකයින්ගේ පුත්තුන්ට කාර් රේස් පැදීම සඳහාද, මිල අධික වර්ගයේ සුරතල් බල්ලන් නඩත්තුව සඳහාද, තම පෞද්ගලික ධනය එකතුකර ගැනීම සඳහාද භාවිත වූයේ මේ ජනතාවගේ සුබ සාධනය වෙනුවෙන් යෙදිය යුතුව තිබූ බදු මුදල්ය.

අප ආණ්ඩු බලය ලබා ගැනීමෙන් පසු මෙම තත්වය් ඉතා විශාල ලෙස වෙනස් විය. පාලකයාගේ හුදු සුබ විහරණය වෙනුවට එම බදු මුදල් ජනතාවගේ සුබ සිද්ධිය වෙනුවෙන් යෙදවීම ඇරඹී තිබේ. බොහෝ අමාත්‍යාංශවල අමාත්‍යවරුන්ගේ වියදම් සීමාවී ඇති අතර මෙතෙක් සිදුවූ බදු මුදල් අපයෝජනය නතර වී ඇත. එලෙසම ටෙන්ඩර් වංචා, අනවශ්‍ය වියදම් සහ මිලදී ගැනීම් නතර වී ඇති නිසා මහජනතාව වෙනුවෙන් එම මුදල් යෙදවීමට හැකි වී තිබේ. මේ තත්වය යටතේ ජනතාව තමන් ගෙවන බදු මුදල නාස්ති නොවන විට, ප්‍රයෝජනවත්ව රටට යොදවෙන විට බදු ගෙවීම ගැන එතරම් කනස්සල්ලක් ඇති කර ගන්නේ නැත. එනිසාම 2025 වසරේ පළමු මාස 07 තුළ නව රජයේ බදු ආදායම ප්‍රමාණාත්මකව ඉහළ ගොස් ඇත.

2024 වසරට සාපේක්ෂව 2025 වසරේ ජනවාරි සිට ජුලි දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු ආදායම් පහත පරිදි වේ.

| | 2025 | 2024 | |
|---|---|---|---|
| | ජන - ජුලි - (රු..මි.) | ජන - ජුලි - (රු..මි.) | වැඩිවීම |
| ආදායම් බදු | 129,123 | 115,808 | 13,315 |
| රඳවා ගැනීමේ බදු | 100,715 | 100,605 | 110 |
| එකතුකල අගය මත බදු | 502,166 | 418,141 | 84,026 |
| අනෙකුත් බදු | 428,806 | 386,080 | 42,726 |
| එකතුව | 1,160,810 | 1,020,634 | 140,176 |

ඉහත බදු ආදායම් ඉහළ යාමට බලපාන හේතු ගණනාවක් ඇතත් මූලිකවම බදු ගෙවන ජනතාවට බදු පිළිබඳ විශ්වාසය ගොඩනැගීම ඉතා වැදගත් වේ. අනෙක් අතට බදු වංචා කිරීමට හෝ බදු පැහැර හැරීමට නොහැකිවීමත්, නීතිය නිසි ලෙස ක්‍රියාත්මක වීමත් විසින් කලින් වසරට වඩා බදු ආදයම ඉහළ ගොස් ඇත. මෙලෙස බදු ආදායම් ඉහළ ගොස් ඇත්තේ ප්‍රධාන බදු අනුපාතයක් වන එකතු කළ අගය මත (VAT) බදු අනුපාත ඉහළ නොදමා සහ පුද්ගල ආදායම් බදුවලට බදු සහන ලබාදී තිබෙන තත්වයක් තුළදීය. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2025 වසරේ ජනවාරි සිට ජුලි දක්වා ඇස්තමේන්තු කළ මුළු බදු ආදායම රුපියල් බිලියන 1,097ක් වුවත් එම කාලය සඳහා දැනටමත් රුපියල් බිලියන 1,160ක බදු ආදායමක් දෙපාර්තමේන්තුව විසින් එකතු කරගෙන තිබේ. ඒ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම වන රුපියල් බිලියන 2,195 පහසුවෙන්ම ළඟා කරගත හැකි බවක් පෙනී යයි.



මෙම බදු ආදායම ඉහළ යාමට සමගාමීව වාහන ආනයනය නැවත ක්‍රියාත්මක කිරීම මගින්ද රජයට ආදායම් ලැබී තිබේ. 2025 මුල් මාස හත තුළ වාහන ආනයනය නිසා රජයට රුපියල් බිලියන 2,850 ක බදු ආදායමක් ලැබී තිබේ. මේ කාලය තුළ වාහන 100,492 ක් ලංකාවට ආනයනය කර තිබේ. 2020 අප්‍රේල් මස සිට වසර පහකට ආසන්න කාලයක් ලංකාවට වාහන ආනයනය අත්හිටුවා තිබුණ තත්වයක් තුළ විදේශ සංචිත ගොඩනගා ගන්නා අතරතුරම මෙලෙස වාහන ආනයනය කිරීමෙන් රජයේ ආදායම ඉහළ ගොස් තිබේ. එය ඉහත සංඛ්‍යාවලින් නිරූපනය වන්නේ නැත.

පසුගිය කාලය මුළුල්ලේම බදු ගෙවන්නන් බදු ගෙවූයේ බලහත්කාරය නිසාමය. ඒ අතර තමන්ට කිසිදු දේශපාලන සම්බන්ධකමක් නොමැති, නීතියට අවනත සාධාරණ පුරවැසියෝ අකමැත්තෙන් වුවද බදු ගෙවූහ. සමහර පුද්ගලයෝ දේශපාලන සම්බන්ධකම් මත බදු ගෙවීම සම්පූර්ණයෙන් පැහැර හැරි අතර නිලධාරී යාන්ත්‍රණය මගින්ද කිසියම් වාසි ලබා ගනිමින් බදු ගෙවීම පැහැර හරිමින් සිටියහ. එහෙත් පුරවැසියන්ට තමන් ගෙවන බද්දේ ප්‍රතිලාභ තමන්ට ලැබෙන බව දැනෙන විට ඔවුහු බදු ගෙවීමට පෙළඹෙති. ලෝකයේ ඇතැම් රටවල් තමන් ගෙවූ බදු කුමන අංශ සඳහා යෙදවූයේදැයි දැනගැනීමට හැකිවන පරිදි බදු ගෙවන්නට ප්‍රකාශනයක් ලබා දෙයි. ඒ අනුව තමන් ගෙවූ බද්දෙන් සෞඛ්‍ය අංශයට, අධ්‍යාපනයට, මහජන සුබසාධනයට කොපමණ මුදලක් වැය වූයේද යන්න දැනගත හැකි නිසා තමන් ගෙවූ බද්ද පිළිබඳව තෘප්තියක් ඇති වේ. එවිට ඔවුහු ස්වේච්ඡාවෙන් බදු ගෙවීමට පෙළඹෙති.

ලංකාවේ අපේ තත්වයද මේ මට්ටමට ළඟාවන දිනය වැඩි ඈතක නොවේ. මිනිසුන්ට දැන් රටේ දේශපාලන අධිකාරිය තුළ හොරකම, වංචාව, නාස්තිය, අල්ලස් ගැනීම සිදු නොවන බවට සක් සුදක් සේ පැහැදිලිය. එනිසාම තමන් ගෙවන බද්ද නැවතත් පොදු සේවාවක් ලෙස තමන්ටම ලැබෙන බවට විශ්වාසයක් පවතී. පසුගිය කාලය තුළ පොදු සේවාවන් වෙනුවෙන් විශාල මුදලක් රජයෙන් වෙන්කළ බව බොහෝ අය දනිති. මාර්ග සංවර්ධනයට, අධ්‍යාපනයට, සෞඛ්‍යට මුදල් වෙන් කෙරෙන බවත් ජනතාව දනිති. ධනේශ්වර රාජ්‍යයක වුවද මහජන බදු මුදල් මහජන සුබ සාධනය වෙනුවෙන් යෙදවෙන නිසා අපගේ පාලනයක් තුළ මෙය අනිවාර්යයෙන් සිදුවන බව ජනතාව දනිති. එනිසා හෙට දවසේදී ජනතාව වැඩි බලකිරීමකින් තොරව බදු ගෙවීමට පෙළඹෙනු ඇත. එහි පෙරනිමිති ලෙස පසුගිය මාස හත තුළ බදු ආදායම වැඩිවීම මගින් දැකගත හැක.



"මිනිසා මාළිගාවකදී හා පැල්පතකදී වෙනස් ආකාරයෙන් සිතයි. සාගින්න නිසා, දුක්ඛිත තත්වය නිසා ඔබට ඔබේ සිරුර තුළ පෝෂණය සඳහා දෙයක් නොමැති නම්, ඒ ආකාරයෙන්ම, ඔබේ ඔළුවේ, ඔබේ මනසේ සහ හදවතේ සදාචාර පෝෂණය සඳහා දෙයක් නොමැත."
**ලුද්විග් ෆෙයාබාහ්ග්**

> පසුගිය කාලය මුළුල්ලේම බදු ගෙවන්නන් බදු ගෙවූයේ බලහත්කාරය නිසාමය. ඒ අතර තමන්ට කිසිදු දේශපාලන සම්බන්ධකමක් නොමැති, නීතියට අවනත සාධාරණ පුරවැසියෝ අකමැත්තෙන් වුවද බදු ගෙවූහ. සමහර පුද්ගලයෝ දේශපාලන සම්බන්ධකම් මත බදු ගෙවීම සම්පූර්ණයෙන් පැහැර හැරි අතර නිලධාරී යාන්ත්‍රණය මගින්ද කිසියම් වාසි ලබා ගනිමින් බදු ගෙවීම පැහැර හරිමින් සිටියහ. එහෙත් පුරවැසියන්ට තමන් ගෙවන බද්දේ ප්‍රතිලාභ තමන්ට ලැබෙන බව දැනෙන විට ඔවුහු බදු ගෙවීමට පෙළඹෙති.



# ප්‍රජා ශක්ති

## රටක් වෙනුවෙන් හෙටක් වේවී...

එක තතක් වුව බිඳී නැති විට
වෙණ නදක් මිහිරිව වැයේවී
නේක පැහැ ගත් උදා අහසින්
රැයක අඳුරක් සමුගනීවි
රැලෙන් වෙන්වී නොයා ඉගිලී
කිරිල්ලක තුටු ගී ගයාවී
ගැහැනු අපි එක මිටට හිඳිමින්
රටක් වෙනුවෙන් හෙටක් වේවී

කඩා වැටෙනා ගැහැනු හිත්වල
මෘදු ස්වරය හෙමි හෙමින් අල්ලා
දරා ගත් කම්කටොළු, කඩතොළු
බිඳුණු තැන් ඔසුවකින් ගල්වා
හීනවලටත් හෙටක් අරගෙන
හදවතේ නෙක පහන් දල්වා
සොවින් බර වූ කණ කෙකිනියනි
එක්ව පියඹන්නට වරෙල්ලා..!

# අත්හැරිය නොහැකි වගකීම!

පොදුජනයා පෙලෙන ගැටලු සඳහා නොයෙක් හේතු කාරණා තිබෙන්නට පුළුවන. එයිනුත් සාධාරණ ලෙස ආර්ථිකයේ ප්‍රතිලාභ බෙදීනොයාම ප්‍රධාන කාරණාවකි. දරිද්‍රතාවයන් පසුගිය කාලවකවානුව තුළ අප රටට අනන්‍ය වූ තත්ත්වයක් ලෙසට ජන ජීවිත තුළ මුල් බැසගෙන තිබුණි.එයින් ගැලවීම හෝ ගැලවීමේ මගක් සෙවීම පෙනෙන තෙක් මානයකවත් නොතිබුණි. රටේ පැවති මෙම විෂයමූල තත්වයත් ප්‍රගතිශීලී බලවේගවල මතවාදී බල පෑම නිසා ගොඩනැගුණු මනෝමූල තත්වයත් හේතුවෙන් සාම්ප්‍රදායික දේශපාලන ව්‍යාපාර පරදවා ජාතික ජන බලවේගයට රටේ පාලන බලය හිමි විය.

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් යන තේමා පාඨය පෙරදැරි කර ගනිමින් බලයට පැමිණි ජාතික ජන බලවේගය ඒ සඳහා ප්‍රධාන බාධකයක් වූ දරිද්‍රතාවය තුරන් කිරීම අරමුණු කර ගනිමින් 'ප්‍රජා ශක්ති' සමාජය සවි බල ගැන්වීමේ ජාතික ව්‍යාපාරය නමින් වැඩ පිළිවෙලක් දියත් කර තිබේ.

ඒ අනුව බහුමානික දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගෙන් 95% ක් පමණ ජීවත් වන්නේ ග්‍රාමීය හා වතු ආශ්‍රිතව බව හඳුනාගෙන තිබේ. .බහුමානික දරිද්‍රතාවය යනු සෞඛ්‍ය ,ජීවන තත්ත්වය, සහ අධ්‍යාපනයේ දරිද්‍රතාවයයි. මුළු ජනගහනයෙන් සෑම පුද්ගලයන් හය දෙනකුගෙන් එක් අයෙකුම බහුමාන දරිද්‍රතාවයෙන් පෙලෙන බව හඳුනාගෙන ඇත. එබැවින් මෙම වැඩ පිළිවෙල බිම් මට්ටම දක්වා ගෙන යාමට ජාතික ජන බලවේගයේ කාන්තාවන් වන අප වෙත සුවිශාල වගකීමක් පැවරී තිබේ.

මෙම වැඩසටහන බහුවිධ සංවර්ධන ක්ෂේත්‍රයයන් ඔස්සේ සමාජගත වීමට නියමිතව තිබේ. විශේෂයෙන් සමාජ, පරිසරය, ආහාර සුරක්ෂිතතාවය, මානව සම්පත් සංවර්ධනය, සැපයුම් ජාල සංවර්ධනය, රැකවරණය, නිෂ්පාදන ආර්ථිකය, ආදීය තුළින් එහි ප්‍රතිලාභ රැසක් ග්‍රාමීය මට්ටමේ බහුමාන දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවට ලබා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් තලයකට රැගෙන යාමත් ඒ තුළින් ප්‍රීතිමත් සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහිකිරීමත් අරමුණවේ.

ගැහැනු අපි එක මිටට එකතු කිරීමේ වැඩපිළිවෙළ තුළ රට පුරා කාන්තාවන් සංවිධානය වීම ජාතික ජනබලවේගයේ ජයග්‍රාහී ගමනට මනා පිටිවහලක් වූ බව නොකිව මනාය.ඒ අනුව තවදුරටත් ශක්තිමත් වෙමින් ග්‍රාමීය මට්ටමෙන් කාන්තා සභා ගොඩනැගීම ද ඒවා වරින් වර මුණ ගැහෙමින් සාකච්ඡා කරමින් ගැටලු හඳුනා ගනිමින් ඒ ගැටලු විසඳීම සඳහා ක්‍රියාත්මක වෙමින් සක්‍රීය ලෙස ඉදිරියට යාම අනිවාර්යය. ඒ අනුව ප්‍රජාශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දායක කරගන්නට සුදුසුම කණ්ඩායමක් ලෙස අපේ රටේ ජාතික ජන බලවේග යේ කාන්තා නියෝජනය හැඳින්වීම වරදක් නොවේ.

ගෘහ ඒකකයක් තුළ පවතින ගැටලු වඩා හොඳින් ග්‍රහණය වන්නේ එකී ඒකකයේ ජීවත්වෙන මවට,ගෘහණියට හෝ බිරිඳටය. විශේෂයෙන් තම පවුලේ සෞඛ්‍ය තත්ත්වය කොතරම් සාධනීය මට්ටමක පවතින්නේද යන්නත් තම පවුලේ ආර්ථිකය තමන්ගේ ජීවන තත්ත්වය තීරණය කරන ආකාරයත් පිළිබඳ ඇයට මනා වැටහීමක් තිබේ. නමුත් මේ සියලු කාරණා සමාජ ආර්ථික දේශපාලන හේතූන් මත පැන නැඟී ඇති බව තේරුම් ගන්නා පිරිස අතළොස්සකි. .සමාජය තේරුම් ගැනීමටත් එය වඩා යහපත් අයුරින් වෙනස් කිරීමටත් හැකි වන්නේ අධ්‍යාපනය ලබා දීමෙන් පමණකි. මේ ක්‍රියාවලිය ජනගත කරමින් ජනතාව ප්‍රජාශක්ති වටා ඒකරාශී කරගැනීමටත් එය වඩා ඵලදායී ලෙස පොහොසත් රටක් ලස්සන ජීවිතයක් වෙනුවෙන් දිශාභිමුඛ කිරීමටත් තම දායකත්වය ලබා දීම කාන්තා අපගේ අත්හැරිය නොහැකි වගකීමකි.



**සුනේත්‍රා රත්නසිරි**
**මහර ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි**

# අපේ වැඩපිළිවෙළ වටා කාන්තාවන් සීඝ්‍රයෙන් එක්වෙනවා!

මේ මොහොත වන විට අපේ රටේ සෑම කාන්තාවකටම සතුටු වෙන්න පුළුවන් වටපිටාවක් ගොඩනැගෙමින් තියෙනවා. ඒ ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ ක්‍රියාත්මක වෙමින් තිබෙන වැඩපිළිවෙලත් සමග.

ඒ වගේම දැන් අපේ ආණ්ඩුව යටතේ කාන්තාව සවිබල ගැන්වීමේ වැඩපිළිවෙළවල් රට පුරාම දියත් වෙමින් පවතිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ප්‍රදේශයේ කාන්තාවන් එක්රැස් කරමින් ගොඩනැගෙන වනිතා සභා මගින් නිවසට, මුළුතැන්ගෙට, කොටුවුන කාන්තා ශ්‍රමයට, වටිනාකමක් ගොඩනැගෙන ව්‍යාපෘති හැදෙමින් තියෙනවා. පැය 8 රැකියාවට යා නොහැකි, නොයෙකුත් හැකියාවන් දක්ෂතා තිබෙන අපේ කාන්තාවන් සෑම ග්‍රාම නිලධාරී වසමකම ඉන්නවා. ඒ අයට නිවසේ සිට කුඩා දරුවන්, දෙමව්පියන් රැකබලා ගනිමින් කළ හැකි, ආර්ථිකයට දායක කර ගත හැකි, කුඩා ව්‍යාපාරවලට මාර්ග ඇති කරන, කාන්තාව සවිබල ගන්වන වැඩපිළිවෙළවල් රට පුරා ක්‍රියාත්මක වෙමින් තියෙනවා.

ඒ වගේම “පොහොසත් රටක ලස්සන ජීවිතයක්” උරුම කරන තේමාව සාක්ෂාත් කර ගැනීමට, සෑම ප්‍රදේශයකම කාන්තාව දැනුවත් කරමින් ඒ මගින් රටේ ආර්ථිකයට කාන්තාවගේ දායකත්වය ලබාගනිමින් සමාජය යහපත් තැනට යොමු කරන දිශාවට අපි සීඝ්‍රයෙන් ගමන් කරමින් තිබෙන බව ප්‍රකාශ කළ හැකියි.

## ජන මතය!









මුල් ළමාවිය රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ ජාතික සතිය පසුගිය ජුලි 14 - ජුලි 20 දක්වා පැවැත්විණි.
දීපව්‍යාප්තව ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් මෙම සතිය පුරාවටම විවිධ වැඩසටහන් සංවිධාන කර තිබූ අතර එහි සමාප්ති උළෙල ඉකුත් ජුලි 20 වන දින කාන්තා සහ ළමා කටයුතු ගරු අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් සහෝදරිය සහ ගරු නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය නාමල් සුදර්ශන සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් සිඟිති දූ දරුවාන් පිරිවරාගෙන විහාර මහා දේවි උද්‍යාන පරිශ්‍රයේ දී පැවැත්විණි.





ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ 2025 ජාතික අයවැය කතාවේදී ”ආයතනික රැකවරණය හෝ භාරකාරත්වය සිටින ළමුන් හෝ වීදි ළමුන් සඳහා ජීවන වියදම් දීමනාවක් ලබා දීම” මැයෙන් රු.මි.1000 ක ප්‍රතිපාදන වෙන් කරමින් ලබාදුන් බලාපොරොත්තුව මල් ඵල ගන්වමින් එම දරුවන් සඳහා රු:5000/= ක ජීවන වියදම් දීමනාවක් ලබා දීම සඳහා කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඒකාබද්ධව නිර්මාණය කළ ”අරුණ” වැඩසටහන පසුගිය ජුලි 15 දින අග්‍රාමාත්‍ය හරිනි අමරසූරිය සහෝදරියගේ ප්‍රධානත්වයෙන් එළි දක්වනු ලැබීය.



කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ කාර්යයභාරය, කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් යෝජනා කර ඇති නව ව්‍යාපෘති සහ ඉදිරි සැළසුම් පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පසුගිය ජුලි 8 වන දින පාර්ලිමේන්තුවේදී පැවැත්විණි.

# අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණ රටට නව පරිවර්තනයක් කැඳවීමයි

*(ජූලි 24 දින අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විවාදයට එක් වෙමින්)*

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ලෙස යෝජනා කරනු ලබන්නේ හුදු විෂය නිර්දේශ සංශෝධනයක් නොව සමස්ත රට නව පරිවර්තනයක් කරා කැඳවීම සඳහා වූ වැඩපිළිවෙළක් බව පෙන්වා දුන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා, එමගින් මෙරට සමස්ත සමාජ තලයත් ආර්ථික තලයත් එකවර ඔසවා තබනු ඇති බව අවධාරණය කළේය.

ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 24වැනි දින පැවති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පාර්ලිමේන්තු විවාදයට එක් වෙමිනි. වැඩිදුරටත් අදහස් දක්වමින් අනුර කුමාර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

මේ අධ්‍යාපන ක්‍රමයත්, මේ අධ්‍යාපන ක්‍රමය විසින් බිහි කර තිබෙන තරුණ පරම්පරාවත්, ඒ වගේම මේ අධ්‍යාපන ක්‍රමය විසින් ඇති කර තිබෙන ආර්ථිකයත් පිළිබඳ අප කිසිවෙකුට සෑහීමකට පත් විය නොහැකියි. ඒ නිසා අපට ඉතා පුළුල් අධ්‍යපන ප්‍රතිසංස්කරණයක් අවශ්‍යයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව මතු වන විට ඉතිහාසය ඇතුළත් වෙලා තිබෙනවාද නැද්ද වැනි කරුණු පිළිබඳ සාකච්ඡා කරන්න ගත්තා. ඇත්තටම මේ යෝජනා කරන්නේ කිසිසේත්ම විෂය නිර්දේශ පිළිබඳව පමණක් වූ සංශෝධනයක් නොවෙයි. මේ යෝජනා කරන්නේ අපේ සමස්ත සමාජයත්, ආර්ථික දේහයත්, අපේ රටේත් අලුත් පරිවර්තනයක් සඳහා වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක්.

ආර්ථික වශයෙන් බැලුවොත් අපේ රට ආසන්න වශයෙන් ලෝකයේ රාජ්‍ය අතර ජන ඝනත්වයෙන් 38 වන ස්ථානයේ සිටිනවා. ඒ අනුව අප රටවිශාල ජන ඝනත්වයක් සහිත රටක්. චීනයේ ජන ඝනත්වයටත් වඩා අපේ රටේ ජන ඝනත්වය වැඩියි. ස්වභාවික සම්පත් ලෙස ගතහොත් විශාල වාණිජමය සම්පත් අපට අඩුයි. තෙල්, ගෑස්, රත්රන් නිධි, තුන්තනායගම් නිධි, යපස් ආදිය අපට නැහැ. එසේ නම් අප සතුව ඇති වටිනාම සම්පත තමයි, මේ රට ගොඩනැඟීම සඳහා තියුණු කළ යුතු සම්පත තමයි මානව සම්පත. ඒ නිසා අපේ ආර්ථික උපායමාර්ගය තුළ, මේ මානව සම්පත දියුණු කිරීමෙන් කොහොමද අපේ රාජ්‍යය අලුත් තැනකට ගෙන යන්නෙ කියලා අපි වඩාත් වැඩියෙන් අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

අපි සාමාන්‍යයෙන් ගතහොත් රැකියා සඳහා විදෙස්ගත වූවන් ගෘහ සේවය, නුපුහුණු, අර්ධ පුහුණු, පුහුණු, වෘත්තීමය ලෙස අප වර්ගීකරණය කරනවා. වෘත්තීමය වශයෙන් ගතහොත් අපේ විදෙස්ගත වන ශ්‍රමිකයන් ගෙන් 3%කට ආසන්න ප්‍රමාණයක් තමයි, වෘත්තීමය රැකියා සඳහා ප්‍රවිෂ්ට වී තිබෙන්නේ. 97%ක්ම තිබෙන්නේ පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු කියන මට්ටමේ. එයිනුත් අපට පෙනෙනවා ලෝකයේ වෙළඳපොළවල් දෙකක් තිබෙනවා. භාණ්ඩ සහ සේවා වෙළඳපොළක් තිබෙනවා. ලෝකයේ ශ්‍රම වෙළඳපොළක් තිබෙනවා. අපි ලෝකයේ අත්පත් කර ගෙන තිබෙන්නේ ලෝකයේ වඩාත් පහළ ශ්‍රම වෙළඳපොළක්.

ඒ නිසා ආර්ථික වශයෙන් ගතහොත් ලෝකයේ දියුණු ශ්‍රම වෙළඳපොලක් අපි අත්පත් කර ගත යුතුයි. ඒ සඳහාත් අපට ඉතාමත් ගුණාත්මක, ලෝකයේ ඒ මොහොතේ මතු වන දැනුම අත්පත් කර ගත්, බෙදා ගන්නා ලද අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාව තිබෙනවා. අනෙක් පසින් සමාජීය ලෙස ගතහොත් අපේ නූගත්භාවයයි, දුප්පත්භාවයයි එකට යන්නේ. නූගත් නම් සැලකිය යුතු ප්‍රමාණයකින් දුප්පත්. දුප්පත් නම් සැලකිය යුතු ප්‍රමාණයකින් නූගත්. ඒ නිසා මේ දුප්පත්භාවය තුරන් කිරීමේ වැඩසටහනක් ලෙස ගත්තත් එය තුරන් කර ගැනීම සඳහාත් අපිට අධ්‍යාපනය ඉතා විශාල මෙහෙවරක් ඉටු කරනවා. සාමාන්‍යයෙන් අපේ ගම්වල කියනවා පවුලකින් එක් අයෙක් ඉගෙන ගත්තොත් මුළු පවුලම ගොඩයනවා කියලා. ඒ නිසා මේ දුප්පත්භාවයෙන් මුදා ගැනීම සඳහාත් අධ්‍යාපනය අතිශය වැදගත්. අනෙක් පසින් ගත්තොත් අපේ රටේ අපරාධ. බන්ධනාගාරගත වූවන්ගෙන් 80%කට ආසන්න ප්‍රමාණයක් සාමාන්‍ය පෙළට පහළින් ඉන්නේ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් ගෙන් 70%කට ආසන්න ප්‍රමාණයක් අටේ පන්තියට පහළින් ඉන්නේ. ඒ අනුව බැලුවම මේ සමාජ අපරාධ, මත්ද්‍රව්‍ය අතරත් අධ්‍යාපනයේ සබඳතාවක් තිබෙනවා. ඒ නිසා මේ ආර්ථික දේහයේ, මේ සමාජයේ යහපත් පරිවර්තනයක් අපි අපේක්ෂා කරනවා නම් ඒ පරිවර්තනයේ මූල බීජය, ආරම්භය, පදනම අධ්‍යාපනයයි. අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් මේ අධ්‍යාපනයේ පුළුල් පරිවර්තනයක අවශ්‍යතාව පෙන්වා දුන්නේ ඒ නිසයි. පළමුවෙන්ම අප හඳුනා ගත යුතුව තිබෙනවා, මේ අධ්‍යාපනයේ තිබෙන ගැටලු ප්‍රමාණය. මොකද අපි පොළොවේ සාමාන්‍ය සමාජයේ නැති ගැටලුවලට විසඳුම් සොයා එලක් නැහැ. අපි සෙවිය යුතු වන්නේ මේ මොහොතේ අපේ අධ්‍යාපනය මුහුණ දී තිබෙන අර්බුදයට විසඳුම්.

ඒ අනුව එක් අර්බුදයක් තමයි අපේ දරුවන් පාසල් හැර යාම. ආසන්න වශයෙන් 2019 වසරේ දරුවන් 16,673ක් පාසල් හැර ගොස් තිබෙනවා. 2022 වසරේදී 20,759ක් පාසල් හැර ගොස් තිබෙනවා. 2024 වසරේදී 20,755ක් පාසල් හැර ගොස් තිබෙනවා. ඒ කියන්නේ තවදුරටත් ඉගෙන ගැනීමට තිබියදී ඔවුන් පාසල් හැර යනවා. මා කියන්නේ කිසිදු දරුවෙක් 13 වසරක අනිවාර්ය අධ්‍යාපනය ලබා ගැනීමෙන් තොරව පාසල් හැර නොයා යුතුයි.

තවදුරටත් කියනවා නම් 2006 වසරේ උපන් දරුවන් පාසැලට ඇතුළත් වන්නේ 2011 වසරේදීයි. 2011 වසරේදී දරුවන් 358,596ක් පාසැලට ඇතුළත් වී තිබෙනවා. එම දරුවන් සාමාන්‍ය පෙළ විභාග යට මුහුණ දෙන්නේ 2021 වසරේදීයි. එහෙත් සාමාන්‍ය පෙළට මුහුණ දී තිබෙන්නේ දරුවන් තුන්ලක්ෂ එකොළොස් දහසක් පමණයි. ඒ අනුව 47,000කට ආසන්න සංඛ්‍යාවක් පාසල් හැර ගොස් තිබෙනවා. මේ දරුවන්ට 13 වසරක අනිවාර්ය අධ්‍යාපනය ලබාදී මේ දරුවන් රැක ගැනීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙනවා. අපේ දරුවන් අතරමැදදී පාසල් අත්හැර නොයා යුතුයි. කිසි දරුවකුට ඒ ඉරණම අත් නොවිය යුතුයි.

ඔවුන්ගේ ආර්ථික පසුබිම්, දෙමාපියන්ගේ ගැටුම්, දෙමව්පියන් විදෙස් ගත වීම්, අනාරක්ෂිත තත්ත්ව ආදි කරුණු විශාල ප්‍රමාණයක් දරුවන් පාසල් හැර යාමට බලපා තිබෙනවා. අපි අධ්‍යාපන වැඩසටහන හදන ගමන් දරුවකු දින තුනක් අඛණ්ඩව පාසැලට නොපැමිණෙන්නේ නම් රාජ්‍ය නිලධාරියෙකු විසින් ඒ දරුවා පිළිබඳව පුද්ගලිකව විමර්ශනයක් කළ යුතුයි. 13 වසරක අධ්‍යාපනය දක්වා හැම දරුවෙකුම පාසැලේ රඳවා ගත යුතුයි. එය මේ වැඩසටහනේ අඩංගු වී තිබෙනවා.

දෙවනුව, බොහෝ විට අපේ රටේ සාකච්ඡාවට ලක් වන්නේ උසස් අධ්‍යාපනය



**ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා**

පිළිබඳවයි. එහෙත් අපි මුහුණ දී තිබෙන ප්‍රධානම ගැටලුව තිබෙන්නේ පාසල් අධ්‍යාපන ක්‍රමයේයි. 2023 වසරේ එකම ළමයෙක්වත් ඇතුළත් නොවුන පාසල් 98ක් තිබෙනවා. ඒ වගේම ළමයි 10ට වඩා අඩු පාසල් 115ක් තිබෙනවා. ඒ වගේම ළමයි 20ට වඩා අඩු පාසල් 406ක් තිබෙනවා. ළමයි 30ට වඩා අඩු පාසල් 752ක් තිබෙනවා. පාසල් 1141ක් තිබෙනවා, ළමයි 40ට වඩා අඩුයි. පාසල් 1506ක් තිබෙනවා ළමුන් 50ට වඩා අඩුයි. ඒ කියන්නේ ආසන්න වශයෙන් මුළු පාසල් පද්ධතියෙන් 15%ක්.

එපමණක් නොවෙයි ළමයි 100ට වඩා අඩු පාසල් සංඛ්‍යාව 3144ක් තිබෙනවා. ආසන්න වශයෙන් රජයේ පාසල් අතරින් 1/3ක ළමයි 100ට වඩා අඩුයි. මේ තත්ත්වය හොඳද? මෙවන් පාසැලක සාහිත්‍ය උලෙළක්, ක්‍රීඩා උත්සවයක්, විනෝද චාරිකාවක් , සම වයස් දරුවන් අතර ගැවසීමක් වැනි කිසිවක් සිදු වන්නේ නැහැ. ඒ නිසා මේ පාසල් පද්ධතිය පිළිබඳ නැවත සමාලෝචනය කළ යුතුයි. ඒ තීන්දුව අනිවාර්යයෙන් අපි ගන්නවා.

සමහර පාසල් තිබෙනවා වසා දැමිය යුතුයි. සමහර පාසල් ඒකාබද්ධ කළ යුතුයි. සමහර ප්‍රදේශවල අලුතින් පාසල් ආරම්භ කළ යුතුයි. පාසල් යළි ස්ථානගත කිරීමක් පිළිබඳව අපි සැලකිල්ලට භාජනය කළ යුතුයි. දරුවකුට අලුත් සමාජයක්, අලුත් අත්දැකීමක් සමඟ අලුත් අවස්ථා ලැබිය යුතුයි. ගමෙන් පාසලට, පාසලෙන් ගමට එක සමාජ තත්ත්වයක දරුවන් වියැකිලා යනවා. කිසි දරුවෙකුට මේ ඉරණම අත් නොවිය යුතුයි.

සමහර දෙමව්පියෝ ඉන්නවා, තමන්ගේ දරුවා ගමේ පාසලට යවන්නේ නැහැ. උපරිම පොර බදනවා දරුවා නගරේ පාසලට යවන්න. හැබැයි, ඒ වගේම ගමේ පාසල තියා ගන්න සටන් කරනවා. මොකක්ද ඒකේ තේරුම? අපි අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ දීර්ඝ ලෙස සාකච්ඡා කර තිබෙනවා පාසලෙන් පාසලට ගොස් එම පාසල් පරීක්ෂා කළ යුතු බවට. ප්‍රවාහන අවශ්‍යතා සපුරන්න අපි සූදානම්. මොකද ගොඩනැගිලි, මානව සම්පත් තිබුණත් පාසැලේ ඉන්නේ ළමයි 10 නම්, ඒ ළමයින්ට නගරයේ පාසලට යාමට බස් රථයක් දීම ප්‍රතිඵලදායකයි.

පාසල් පද්ධතියේ ඇති වී තිබෙන ගැටලුව තව දුරටත් විග්‍රහ කරනවා නම් මෙහිදී මානව සම්පත කොපමණ අපතේ යනවාද? සාමාන්‍යයෙන් අපේ රටේ ගුරු ශිෂ්‍ය අනුපාතය තිබෙන්නේ 1:18යි. එම අනුපාතය ඉතා ප්‍රශස්ත අනුපාතයක්. නමුත් අදත් අපි දිස්ත්‍රික්කවලට ගොස් බැලුවොත් ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. සිසුන් 50ට වඩා අඩු පාසල්වල අනුපාතය 1:5 යි. හම්බන්තොට එක පාසලක ළමයි 30යි. ගුරුවරු 9යි. මානව සම්පත් අපතේ යමින් තිබෙනවා. ත්‍රිකුණාමලේ කුච්චවේලි ප්‍රදේශයේ පාසලක් තිබෙනවා. ළමයි දෙන්නයි. ගුරුවරු දෙන්නයි. බණ්ඩාරවෙල හල්දුම්මුල්ල අධ්‍යාපන කොට්ඨාසයේ පාසලක් තිබෙනවා ළමයි තුනයි, ගුරුවරු තුනයි. ත්‍රිකුණාමලේ තවත් පාසලක ළමයි හතරයි, ගුරුවරු හතරයි. මේ ළමයින්ට ප්‍රතිඵලත් නැහැ. ගුරුවරුන්ට ප්‍රතිඵලත් නැහැ.

අපේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන තුළින් සෑම දරුවෙකුටම ප්‍රශස්ත මට්ටමේ පාසල් අධ්‍යාපනයක් ලබා දීමේ වගකීම ආණ්ඩුව භාර ගන්නවා. මෙරට පාසල් පද්ධතිය පිළිබඳ යළි සලකා බැලීම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය තුළින් අපි සැලකිල්ලට භාජනය කරනවා. එය මෙහි වැදගත්ම සාධකයක්. පහසුකම් සහිත පාසලක්, අවශ්‍ය මානව සම්පත සහිත පාසලක්, තමන් ජීවත් වන පරිසරයෙන් ඉදිරියට යන සමාජ ක්‍රියාකාරකම් සහිත පාසලක් දරුවාට අවශ්‍යයි. එහෙම පාසලක් අවශ්‍ය නැද්ද? අපේ අධ්‍යාපනය සැලකිය යුතු ප්‍රමාණයකින් අපේ දරුවන් යාන්ත්‍රීකරණයට ලක් කර තිබෙනවා. අද ගම්වල වොලිබෝල් පිටියක් නැහැ. ගොයම් කපලා ඉවර වුණාම කුඹුරුවල එල්ලේ ගහනවා. ගමේ වැවේ එගොඩ මෙගොඩ පීනනවා. වෙසක් උත්සවයේදී ගමේ දරුවන් එකතු වෙලා චිත්‍ර ඇඳලා තොරණ ඉදි කරනවා. අද එවැනි ක්‍රියාකාරකම් දරුවන්ගෙන් දකින්න නැහැ. යන්ත්‍ර වගේ, තෙතමනයක් නැති, සහකම්පනයක් නැති, සමාජය පිළිබඳ වගකීමක් නැති දරු පරම්පරාවක් අද නිර්මාණය වී තිබෙනවා.

දැන් දරුවන් අපේ කාලයේ වගේ නෙමෙයි කියලා සමහර විට දෙමාපියන් කියනවා ඇහෙනවා. ඒක ඇත්ත. අපේ කාලයේ වගේම ඊට වඩා උසස් දරුවොත් සිටිය යුතුයි. පාන්දර 4ට ටියුෂන් පටන් ගන්නවා. පන්ති ඉවර වුණාට පසුව තමයි පාසලට යන්නේ. ඒ දරුවාට තිබෙන ජීවිතය කුමක්ද? පාසල ඉවර වෙලා ආයෙත් පන්තියට යනවා. ඒ දරුවාට ළමා ජීවිතයක් අවශ්‍ය නැද්ද? කවියක්, ගීතයක් රසවිදින්නේ නැති දරුවො, නවකතා පොතක් කියවන්නේ නැති දරුවො, සාහිත්‍ය පෝෂණයක් නොමැති දරුවො, සමාජ ක්‍රියාකාරකමක් නැති යන්ත්‍ර වගේ දරුවො හදන්න ඕනද? මෙහෙම රටක් ඉදිරියට යන්න බැහැ. මේ දරුවා මත පටවා තිබෙන අධ්‍යාපන බර අඩු කරන්න අවශ්‍යයි, ඒක අපේ වගකීම. දරුවාව නැගිටවන කොටත් නිදි, වාහනයේත් නිදි, පාසලේත් නිදි. දරුවන් පවු නැද්ද? රොබෝවරු වගේ හදන දරු පරම්පරාව වෙනස් කරන්න අවශ්‍ය නැද්ද?

දරුවෙකුට සජීවී ජීවිතයක් ලබා දීමේ අරමුණින් මුළු අධ්‍යාපනයම, විෂය, ඉගැන්වීම, ඒකට තිබෙන බර, ප්‍රමාණය නිර්ණය

11 වැනි පිටුවට

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පත්තරයක් හතරට නමලා ඒක දිහා බලාගෙනම පංතියට එනකොට ළමයි හිටියෙ පොලිටික්ක එයි කියන අදහස අතෑරලා... තම තමන්ගෙ වැඩවල.

"ආයුබෝවන් සර්..." "ගුඩ් මෝනිං සර්..." අනුරුද්දියයි වසන්තියයි දෙන්නම පියවි සිහියට ආවා. "අපි හිතුවෙ සර් එන එකක් නෑ කියලා"

"ආයුබෝවන් ළමයිනේ... මම පත්තරයක් ගන්න ගියානෙ... පොඩ්ඩක් පරක්කු වුණා" පොලිටික්ක පත්තරේම කියවන තරම් වෙලාව ගියත් කියල දැම්ම... "මෙන්න සජිත් මහත්තයා කියනවා ඉතිහාස විෂය සම්පූර්ණයෙන් අයින් කරන්න යනවා කියලා" පොලිටික්ක අල්ලපු පංතියෙ හිස්ටීරියාවට ඇහෙන්න තරම් සද්දෙට කිවුව.

"ආ... සජිත් මහත්තයා කියන ඒවා සීරියස් ගන්න එපා සර්... එයා ඔය වගේ ගොඩක් දේවල් කලිනුත් කිවුව. එක්කො සජිත්ට සිංහල තේරෙන්නෙ නෑ... එක්කො ඩිමෙන්ෂියා... අමතක වීමේ රෝගය" මංජුවගේ කරේ ස්ටෙත් එක නැතුවා විතරයි.

"හරිනි අගමැතිතුමිය ඉන්තේරුවෙන්ම කියනවා ඉතිහාසයයි, සෞන්දර්යයි අයින් කරන්නෙ නෑ කියලා" ඊවන් චමිය පවා අප්ඩේටට්..."නමය පංතිය වෙනකම් කොහොමත් තියෙනවා. ඊට පස්සෙ ඒවා අනිවාර්යයෙන්ම තෝරගන්න වෙනවා. ඊට වඩා මොනාද?"

"ඊයෙ ඉඳලා සිද්ධ වුණු හැමදේම ඉතිහාසයට අයිතියිනෙ. ඉතින් ඉතිහාස විෂයත් අප්ඩේට් කළානම් හරි. ඔය කතා ඉවරයි" මංජුව ප්‍රෙහේලිකාවක් දිගඇරිය.

"එතකොට කොහොමද එයාලගෙ කතා නවතින්නෙ?" අනුරුද්දිය උත්සාහයක් නැතුවම පුරවන්න බැලුව.

"ඉතිහාස විෂයට ජේආර්ගෙ 83 කළු ජූලිය, 88/89 ප්‍රේමදාසගෙ මිනීමැරුම්, ගෝඨාභයගෙ මාතලේ ඝාතන, අවසන් මහින්ද රජ පවුල හොරා කාපු හැටි ඇතුල් කළොත් ඔය සුන්බුන් විපක්ෂෙ කවුරුවත් ඉතිහාස විෂය ගැන සංවාද කරන්න එන්නෙ නෑ" මංජුව ඉතිහාසය පීඑච්ඩී ලෙවෙල් එකට කැට තිබ්බෙ කාගෙත් අනුමැතිය ඇතිව.

"අන්න තරුණ සමිතිවලට දේශපාලනේ ගෙනල්ලා කියලා කතාවක් යනවා" පොලිටික්ක ආපහු ට්‍රැක් එකක් පාදනව ඔළුව උස්සගන්න පුළුවන්ද බලන්න.

"මොන විකාර කාතාවක්ද සර්...සාමාජිකත්වයේ බහුතර කැමැත්ත අනුව නම් තෝරන්නෙ ඒ අයට ඕනෙ විදිහටනෙ පත්වෙන්නෙ. දැන් මිනිස්සුන්ගෙ කැමැත්ත උන්ට නෑ කියලා උන් තේරුම් ගන්න එපෑයෑ. දැන් බලේ අහිමි වුණා කියලා කට්ටිය වැලපෙනවා... ඒ සමිතිවල බින්න බැහැගෙන... තරුණයන්ට ලැබෙන දේවල් කකා ඉඳලා... දැන් ඒවා අහිමි වෙනකොට හිතේ අමාරුව... දේශපාලනේ ගේනවා කියලා අඬෝවැඩියාව... දේශපාලනේ නිසා බඩ වඩාගෙන... දේශපාලන වලව්වල ඉඳුල් කකා ඉඳලා... දැන් කියනවා, දේශපාලනේ නිසා එයාලගෙ සනීප තොටිල්ල අවුල් වෙනවලු. දුකට කියන කතා. දූෂිත වළල්ලෙ ගුවන් තොටිල්ල ගැස්සිලා..." සමන හැරෙන තැපෑලෙන් උත්තර බැන්දෙ ප්‍රශ්නෙ තව දිගට ඇදුණොත් අපරාදෙ කියල... මෙහෙම ගියොත් කෙහෙලියලත් කියාවිනෙ එන්පීපී එක ආණ්ඩුවට දේශපාලනේ ගෙනල්ල... එයාලව අයින් කරලා මාර අවුලක් කළා කියලා... කීයක්හරි හොයාගන්න තිබුණු එක නැති කළා කියල කියයිනෙ.

"ට්‍රම්ප්ගෙ බද්ද අඩු කරගන්න බැහැ කියලා බොරුවට නාහෙන් ඇඬුවා. ආණ්ඩුවට රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනු තේරෙන්නෙ නෑ කිවුව. ඇඟලුම් කර්මාන්තය ඉවරයි කිවුව. ෆැක්ටරි වැහෙයි කිවුව. ලක්ෂ ගාණකට රස්සා නැතිවෙයි කිවුව. ඇත්තටම එයාලගේ ප්‍රාර්ථනය තමයි කිවුවෙ... ගෘෂා වැල් පාලමෙන් එගොඩ වුණාට පස්සෙ කෙනෙක් කියනවා... මං හිතුවෙම වැටෙයි කියල... අපරාදෙ මං යාඥා කළේ කියලා. මෙහෙ සුන්බුන් විපක්ෂෙත් ඒ වගේම තමයි..." බස්සත් ඒකටම අත්වැල් ඇල්ලුව.

"අන්තිමට ආණ්ඩුව ඇමරිකාවට ගිහින් සාකච්ඡා කරලා... සූම් සාකච්ඡා කරලා... සියයට 44 තිබුණු බද්ද සියයට 20ට අඩු කරගත්තම කියනවා ඔයිට වඩා අඩු කරගන්න තිබුණාලු... හරියට එයාලා හිටියනම් ට්‍රම්ප් බයට බදු බිංදුව කරයි වගේ..." සමන ඌණ පූර්ණයක් කළා.

"ඔහොම කියන්නෙ ට්‍රම්ප්ට 'මචං ට්‍රම්ප්... හව් ආ යූ' කියලා කතා කරන අය වෙන්න ඇති... අපි දන්නෙ නෑනෙ..." කනියගෙ කතාවට පංතියටම බකස් ගාලා හිනා ගියා.

"ඔය මොනව වුණත් මාලදිවයිනෙන් බැහැපු ජනාධිපතිතුමාගේ ෂර්ට් එකේ පිට පැත්ත පොඩි වෙලා තිබුණ කියල කතාවක් යනව නේද?" පොලිටික්ක වටම ගිහින් ගෙටම එනව... "මේ මම කියන කතාවක් නෙමෙයි... මට ඇහුණා එහෙම කතාවක්"

"ඔව් ඉතින් වෙන මොනව කියල ආණ්ඩුව විවේචනය කරන්නද? ජනාධිපතිගෙ ෂර්ට් එක පොඩි වෙලා කියනවා, අගමැතිනියගෙ ඇඳුම හොඳ නෑ කියනවා. ඇමතිට කවියක් වැරදුණා කියනවා, ඉංග්‍රීසි වචනයක් වැරදුණා කියනවා... මහා අපරාධ වගේ... මොකද මේ... මහ බැංකුව කැඩුවද?, බෙහෙත්වලින් ගහලද? හොරට ඉඩම් ලියගෙනද? හොරට වාහන ගෙන්නලද? හොරෙන් වත්කම් උපයගෙනද? ඥාති හැත්ත බුරුත්ත රජයේ රස්සාවලට පුරෝගෙනද? මහජන මුදලෙන් ගෙවල් අරන් සුරසැප විඳිනවද? වාහන පිරිවරාගෙන පාරවල් වහගෙන රඟනවද?... මේ මොනවත් නෑ. එයාලට විවේචනයක් කරන්න දෙයක් ඇත්තෙ නෑ. වැලේ වැල් නැති අය පිදුරු ගස්වල එල්ලෙනවා..." සමන නන්ස්ටොප් කියාගෙන යන අතරෙ බෙල් එක වදින එක පොලිටික්කට කණට මීපැණි දානවා වගේ...

# ඇඩ්‍රස් නැති ජනතාවට ඇඩ්‍රස්...




සියවස් දෙකකටත් වැඩි කාලයක් විදේශීය සහ ස්වදේශීය පාලකයන්ගේ අනේක විද වද බන්ධන හා පීඩාවන්ට ලක්වී කඳුකරයේ තේ වතු මතම සිය ශ්‍රමය වගුරා අවසන් ගමන් ගිය හා යාමට නියමිත මලයගම් ජනතාව මෙතෙක් කලක් සිටි තැනින් අඩියක්වත් ඉදිරියට ගොස් ඇති බවක් අපට නොපෙනේ. ඔවුන් ගෙවන්නේ තවමත් අර ශත වර්ෂ කිහිපයකට පෙර ඔවුන්ගේ මුතුන් මිත්තන් ගෙවූ ජීවිතය නම් අපි රටක් ලෙසම ලජ්ජාවට පත්විය යුතු නොවේද? රජුන් තනන රජුන් යැයි හැඳින්වූවන් කඳුකරයෙන් කොතරම් බිහි වුණද ඔවුන් රජුන් තනා, ඔවුන්ට ආවඩා තම මජර ජීවිත සුඛිත මුදිත කර ගත්තා මිස තමන් බලයට ගෙන ඒම සඳහා දරදිය ඇද්ද, ඡන්දය දුන් වතුකම්කරු ජනතාවට කළ සෙතක් නැත. අදටත් ඔවුනට නිසි අධ්‍යාපන පහසුකම් නැත. සෞඛ්‍ය පහසුකම් නැත්තටම නැති තරම්ය. අඩුම තරමේ ඉන්නට කියා හරිහමන් නිවසක්ද නැත. අඩුම තරමින් තමන්ට කියා ලිපිනයක්ද නැත. ලිපි ලැබෙන්නේ වත්තේ කාර්යාලයටය. බහුතරය දිවි ගෙවන්නේ මීට ශත වර්ෂ කිහිපයකට පෙර සුද්දා තැනූ ලයිම් කාමරවලය. වැසිකිළි කැසිකිළි පහසුකම් පවා නොමැතිවය. ලාංකේය පුරවැසියන් අතර අසරණම පිරිස ඔවුන් බව කිවහොත් එය නිවැරදිය. පෙර කී ජඩ දේශපාලුවන්ගේ පැවැත්ම රඳන්නේද එම අසරණභාවය මතය.

එන්.පී.පී. ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු මේ වන විට ඔවුන්ගේ නිවාස ප්‍රශ්න විසඳීමට පියවර රැසක්ම ගෙන තිබේ. වචනවලින් ඔබ්බට ගොස් අද මහ පොළොවේ වතුකර ජනතාවගේ නිවාස සිහිනය සැබෑවෙමින් තිබේ. නිසි ප්‍රමිතියෙන් යුත් නිවාස ව්‍යාපෘති රැසක වැඩ මේ වන විට අරඹා ඇත. කඳුරට වතුකරයේ එන්.පී.පී. දේශපාලන නායකයන්ගේ මඟපෙන්වීම හා අධීක්ෂණය යටතේ දැන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් තිබේ. ලිපිනයක් සහිත ඔවුන්ගේ නිවසට ළඟදීම ලිපියක් ලැබීමට නියමිතය. අඬබෙර නොගැසුවාට, ශබ්ද පූජා නොපැවැත්වූවාට මහපොළොවේ සත්‍යය වන්නේ එයයි.

# ගින්දර කෑවේ නම් අධෝමුඛයෙන් පිට වන්නේ අඟුරු කීවාලු

රාජ්‍ය ආයතනවල දූෂණ හා වංචාවල නිරත වූ රාජ්‍ය නිලධාරීහු මේ දිනවල පෝලිමට බන්ධනාගාර ගතවෙමින් සිටිති. දේශපාළුවන්ගේ හයිය ගෙන ඔවුන්ගේ වුවමනා එපාකම්වලට අනුව කටයුතු කළ මේ නිලධාරීන්ගේ හවුහරණයට දැන් කිසිවෙකුත් නොමැත. මන්ද එම දේශපාළුවන්ගෙන්ද ඇතැමුන් විවිධ චෝදනාවලට ලක්වී අධිකරණයෙන්ද වරදකරුවන් වී මේ වන විට හිරේ විලංගුවේ වැටී ඇති නිසාය.

බලය සැමදා තමන්ගේ යයි සිතා කටයුතු කළ මොවුන්ගේ හිස මතට ඔවුන්ට අනුව දැන් එන්.පී.පී. ආණ්ඩුව නමැති 'කරුමය' කඩා වැටී තිබේ. ජනතා උරුමය රකින ආණ්ඩුවක් ලාංකේය ඉතිහාසය තුළ බිහිවූවා නම් එය එන්.පී.පී. ආණ්ඩුවම මිස වෙන යමක් නොවන බව දැන් ඕනෑවටත් වඩා පැහැදිලිය. මේ ආණ්ඩුව බලයට නොඑන්නට අර වංචනික නිලධාරී කොට්ඨාසය තවමත් ජනතාවගේ හිසට උඩින් බල්ට් ගසා ජනතා දේපොළ කොල්ලකමින් වැජඹෙනු ඇත.

දැන් මේ වංචනිකයන් ආරක්ෂා කරන ඇතැම් නිලධාරීහු හා විපක්ෂ දේශපාළුවෝ අමුතු තර්කයක් ගෙන එමින් සිටිති. එනම් මේ විදියට රජයේ නිලධාරීන් අත්අඩංගුවට ගැනීම නිසා ඔවුන් දැනටමත් මහත් බියට පත්වී රට හැරයන තත්වයක් උදාවී ඇති බවයි. එනිසා රටේ රාජ්‍ය යන්ත්‍රණයද අවුල් වී කඩා වැටිය හැකි බවයි. මෙහිදී ප්‍රධාන කරුණු දෙකක් අපට මතුවේ. එකක් වංචනිකයන්ට නීතිය ක්‍රියාත්මක වන විට වංචා දූෂණ නොකළ නිලධාරීන් බියවන්නේ කුමටද යන්නයි. අනෙක ඔවුන් රාජ්‍ය ආයතන ජනතාවගේ යහපත පිණිස මෙහෙය වන්නේ නම් මෙවැනි වින්නැහියක් එම ආයතනවලට සිදුවේද යන්නයි. කෙසේ වෙතත් මින් එක කරුණක් අපට පැහැදිලි වේ. එනම් මෙතෙක් රට පාලනය කළ දේශපාළුවන් හා ඔවුන්ට බත්බැලකම් කර නිලතල වරප්‍රසාද, ලබාගෙන සහ වංචා දූෂණවලින් මුදල් උපයා ගත් ඇතැම් රාජ්‍ය නිලධාරීන් යන මේ දෙබෑ ජටිලයන් එකතු වී කෙතරම් අපේ රට කාබාසිනියා කර ඇද්ද යන්නය.



# රනිල්ගේ ක්ලාස්මේට් ඇමරිකාවෙන් මතුවෙයි...

වර්තමාන ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් රනිල් වික්‍රමසිංහගේ ක්ලාස්මේට් කෙනෙක් බව අපි දැනගත්තේ මේ ඊයේ පෙර්දාය. ඒ සමන් රත්නප්‍රියගෙන් සහ දොස් - තර රාජිත සේනාරත්නගෙන්ය. මෙතෙක් කල් එම රහස ඔවුන් සඟවාගෙන සිටියේ ඔවුන්ගේ නිහතමානීකමටදැයි අපි නොදනිමු. එපමණක් නොව එලෝන් මස්ක් රනිල්ගේ මස්සිනා කෙනෙකු බව රටට හෙළි කළේද ඔවුන් දෙදෙනාය. මොවුන් දෙදෙනා පුන පුනා දස අතේ දිවුරමින් කියා සිටින්නේ ඩොනල්ඩ් ට්‍රම්ප් ශ්‍රී ලංකාවට පැනවූ තීරුබදු රනිල් බලයේ සිටියා නම් එක ටෙලිපෝන් කෝල් එකකින් ට්‍රම්ප්ට හා එලෝන් මස්ක්ට කතාකර ඉවත් කර ගත හැකිව තිබූ බවයි. ඒ තරමටම ට්‍රම්ප් සහ මස්ක් දෙදෙනා රනිල්ව ළඟින්ම ඇසුරු කරන බවයි.

මෙය අර සජිත් පසුගිය මැතිවරණ වේදිකාවලදී දිගට කියාගෙන ගිය තමන් ජපන් දන්නා නිසා ජපන් ධනපතියන් ගෙන්ද ඉංග්‍රීසි දන්නා නිසා යුරෝපයේ ධනපතියන්ගෙන්ද මුදල් ඉල්ලාගෙන රට ගොඩනගනවා යැයි කියූ කතාවට නොදෙවැනි කතාවකි. අපේ දුප්පත් පාසල්, තානාපතිවරු හරහා ලෝක ධනපතියන්ට භාරදී නඩත්තු කරන බවත් අපේ රටේ ප්‍රාදේශීය සභා ලෝකයේ දියුණු රටවල ප්‍රාදේශීය සභා සමග ඒකාබද්ධ කර දියුණු කරන බවටත් කියූ කතාවට නොදෙවැනි කතාවකි. මේ විහිළු කථා සත්‍ය සේ පිළිගන්නා අඳබාලයින් එ.ජා.ප.යේ, ස.ජ.බ.යේ තවමත් සිටිත් දැයි අපි නොදනිමු. කෙසේ වෙතත් මේ දිනවල රාජිත සේනාරත්න නම් අධිකරණයට බයේ පැදුරටත් නොකියා පළාගොස් ඇති බව නම් මුළු රටම දනී. ඉදින් රාජිතලාට, රනිල්ලාට, ට්‍රම්ප්ගේම පිහිටයි! ආරක්ෂාවයි! කියා අපි සටහනට තිත තබමු.



# අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අරමුණ...

09 පිටුවෙන්

කිරීමේ ප්‍රතිසංස්කරණ අප ඇති කරනවා. පාසලට ඇතුළත් වන බහුතරයක් ළමුන්ගේ අපේක්ෂාව වෛද්‍යවරයෙකු හෝ ඉංජිනේරුවරයෙකු වෙන්න. අධ්‍යාපනය ඒකීය රේඛීය පාරක් නෙමෙයි. අධ්‍යාපනය කියන්නේ පැතිරුණු පාරවල් ගොඩක්. හැබැයි සිදුවී තිබෙන්නේ කුමක්ද? සමාජ වටිනාකම්, සමාජ ගරුත්වය, වෘත්තීමය වටිනාකම් ක්ෂේත්‍ර දෙක තුනකට කොටු කර තිබෙනවා. දෙමාපියන් හිතනවා, තමන්ගේ දරුවාට හොඳ ජීවිතයක් නම් වෛද්‍යවරයෙක් හෝ ඉංජිනේරුවරයෙක් විය යුතුයි කියලා. තම පවුලට ගෞරවයක් නම් වෛද්‍යවරයෙක් හෝ ඉංජිනේරුවරයෙක් විය යුතුයි කියලා. ඒක වැරදියි. සමාජයක් පවතින්නේ වෛද්‍යවරයෙක්ගෙන් හෝ ඉංජිනේරුවරයෙක්ගෙන් නෙමෙයි. සමාජයක් පවතින්නේ වෘත්තීන් විශාල ප්‍රමාණයක එකතුවකින්. මේ සමාජයට සෑම ක්ෂේත්‍රයකටම වෘත්තීමයභාවයක් අවශ්‍යයි. සෑම වෘත්තියකටම වෘත්තීමයභාවයක් ලබා දිය යුතුයි.

පැතිරුණු පාරවල් ගොඩක්, මේ පැතිරුණු පාරවල් ගොඩින් දරුවා වෘත්තීමයභාවයට ගෙනෙන්න අවශ්‍යයි. අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ඒ ඉලක්කය තිබෙනවා. දරුවෙකුට ගමන් කරන්න මාවතක් අවශ්‍යයි. අද මාවත බවට පත්ව තිබෙන්නේ කුමක්ද? ගුරුවරයා සහ දෙමාපියන් අතර සාකච්ඡාවකින් තොරව දරුවාට පාරක් තේරෙන්නේ නැහැ. අද පාරවල් වෙලා තිබෙන්නේ වැඩි සමාජ වටිනාකම් සහිත දේවල් ඉගෙන ගැනීමයි. වෛද්‍ය පීඨයට යන්න වීමට බැරි වූ දරුවෙක් කෘෂි විද්‍යා පීඨයට එනවා. දොස්තර වීමට බැරි නිසා තමයි එයා කෘෂි විද්‍යාඥයෙක් වෙන්නේ. අද සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ අතර විශාල පරතරයක් තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන පටන් ගත්තාම, 2026 වසරෙදි පටන් ගන්නෙ 6 පන්තියෙන්, 7 පන්තිය 2027 වසරෙ, 8 පන්තිය 2028 දී, 2029 දී 9 පන්තිය. 9 පන්තියට තව වසර තුනකට වැඩි කාලයක් තිබෙනවා. මේ ප්‍රතිසංස්කරණ 2026 පටන් ගත්තොත්, 2029 වසරේදී තමයි තෝරා ගැනීමේ පාර පිළිබඳ සාකච්ඡාවට එළඹෙන්නේ.

මානව ශිෂ්ටාචාරය හදාරන ඉතිහාසඥයෙක් විය හැකි පාරක් තිබෙනවා. ආගම් පිළිබඳ ගැඹුරු ඥානයක් තිබෙන පුරවැසියෙක් හදනවා. එහෙම නෙවෙයිද අවශ්‍ය. භූගෝලය, සමාජ විද්‍යාව, ආගම් පිළිබඳව, ඉතිහාසය පිළිබඳව මූලික පදනම් ටික සෑම දරුවෙකුටම ලැබෙනවා. හැබැයි, ඉන් ඔබ්බට යන විශේෂඥ ඥානයක් අප නිර්මාණය කළ යුතුයි. ඒ සඳහා පාරකුත් තියෙනවා.

ගම්වල හිතන්නේ දරුවන් උසස් පෙළ දක්වා ඉගෙන ගත් විට එය ප්‍රමාණවත් කියලා. ඒ දෙමව්පියන් හිතන්නේ මගේ දරුවට තිබෙන අධ්‍යාපනයේ අවසන් කඩඉම උසස් පෙළ කියලා. උසස් පෙළ අවසන් අධ්‍යාපන මට්ටම නෙවෙයි. එතනින් එහාට ජාතික විශ්වවිද්‍යාල පද්ධතියක් ගොඩනැගිය යුතුයි. උසස් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇති කළ යුතුය. දැනට තිබෙන වෘත්තීය පුහුණු අධ්‍යාපන ආයතන නූතනත්වයට ගැළපෙන ලෙස සකස් වී නැහැ. සමහර වෘත්තීය මධ්‍යස්ථාන වඩුමඩු වගෙයි. කම්හල් වගෙයි. එහෙම තැනකට දරුවන් එන්නේ නැහැ. ආණ්ඩුවේ තිබෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ඇතුළු වන දරුවන් කී දෙනෙක් අවසානය දක්වා ඉගෙන ගෙන තිබෙනවාද යන්න ගැන සංගණනයක් කළ යුතුයි. ඉතාමත් අඩු සංඛ්‍යාවක් වේවි. බොහෝ දෙනෙක් වෘත්තිය පුහුණු අධ්‍යාපනයට ඇවිත් මාස තුන හතරෙන් එයින් ඉවත් වෙනවා. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරන දරුවා සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයට ඇතුළත් වූ දරුවා අතර සංසන්දනාත්මක වෙනසක් තිබෙනවා.

වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය කියන්නේ සරසවි වරම් ගන්න බැරි අයට යන්න තියෙන තැනක් නෙවෙයි. අපේ ප්‍රතිපත්තිය වෘත්තිය පුහුණු අධ්‍යාපනය තේරුණු අධ්‍යාපනයක් නොවෙයි, මූලික අධ්‍යාපනයයි. දැනුම, තාක්ෂණය එකතු කරගත් නූතන වෘත්තීය මධ්‍යස්ථාන 40ක් 2033වන විට ඉදිකිරීමට අප සැලසුම් කරතිබෙනවා. දිස්ත්‍රික්කයකට දෙකක් ස්ථාපිත කරනවා. දරුවා දහතුන් වසරක අධ්‍යාපනයෙන් පසුව විවෘත වෘත්තීය අධ්‍යාපනයකට නිරාවරණය කරනවා. කිසි දරුවෙකු දහතුන් වසරක අධ්‍යාපනයෙන් එළියට වැටෙන්නවත්, අධ්‍යාපනයේ අතරමං වෙන්නවත් අප ඉඩ තියන්නේ නැහැ.

සාමාන්‍යයෙන් ගත් විට දරුවෙකු පාසල් යන්නේ අවුරුදු දහතුනයි. ගුරුවරයෙක් වසර තිහක් පාසල් යනවා. මා සමඟ උසස් පෙළ කළ අය තවම පාසල් යනවා. ඒ නිසා මේ නූතන අධ්‍යාපනය ලබා දීම සඳහා අවශ්‍ය ඥානය හා අත්දැකීම පරිපූර්ණව තිබෙනවාදැයි අප නැවත සලකා බැලිය යුතුයි. ගුරුවරයාට ඇතිවී තිබෙන ඥානය ප්‍රමාණවත් නැහැ. ඔවුන්ගේ දැනුම යාවත්කාලීන වී නැහැ. එවිට නූතන දරුවෙක් නිර්මාණය කරන්නේ කෙසේද? ඒ සඳහා අපට ශක්තිමත් ගුරු පරම්පරාවක් අවශ්‍යයි. මේ අධ්‍යාපනයෙන් ළමයින්ට නිදහසකුත් නැහැ. ගුරුවරුන්ට නිදහසකුත් නැහැ.

ඒ නිසා වසර පහෙන් පහට අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් අවශ්‍යයි. ඒ නිසා ගුරුවරු වසර පහෙන් පහට පුහුණු කිරීමේ වැඩසටහනකුත් ආරම්භ කරනවා. එවිට අප ගුරුවරුන්ගේ අතිරික්තයක් තබා ගත යුතුයි. දැනට සිටින ගුරු මානව සම්පත අප කළමනාකරණය කර ගන්නවා. විෂයන් තේරිය යුත්තේ දේශපාලනඥයෝ නෙවෙයි. එය අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අවශ්‍ය විශේෂඥයන් ලබා දී තිබෙන උපදෙස් අනුව සිදු කරන දෙයක්. අපි විෂය තෝරන ප්‍රතිසංස්කරණය අධ්‍යාපන විශේෂඥයින්ට භාර දී තිබෙනවා. දේශපාලන අධිකාරියට තිබෙන්නේ කාලරාමුව සකස් කිරීමයි. සාර්ථක ව්‍යුහාත්මක පරිවර්තනයක් අත්පත් කර ගැනීමට දේශපාලන අධිකාරියක් තිබෙනවා.



කුමන ව්‍යුහාත්මක පරිවර්තනයක් අධ්‍යාපනයට අවශ්‍යද යන්න අප විවාද කරමු. එයට අදාළ අඩංගුව, විෂයන් කාලරාමු, සලකා බැලිය හැකියි. අප සෑම ක්ෂේත්‍රයක් සඳහාම ප්‍රවීණයන් නොවේ. ඒ නිසා සෑම ජන කොටසක්ම ඒකාබද්ධ කරගෙන මේ ගමන යා යුතුයි. ශ්‍රී ලංකාවේ ආර්ථික දේහයේ ශක්තිමත් පැවැත්මට මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ඉතාම වැදගත් වෙනවා. එම නිසා මේ කටයුත්ත සිදු කිරීමේදී දේශපාලන කණ්ඩායම් සියල්ල එකතු විය යුතුයි. මෙම අධ්‍යාපන ක්‍රමය ගමේ ආරම්භ කිරීමේදී ඊට එරෙහිව වන කණ්ඩායමට එකතු නොවී යහපත් දේ ඉදිරියට ගෙන යාමට සහාය ලබා දෙන්න.

සමහර පාසල්වල විශාල ගොඩනැගිලි, විශාල රංග ශාලා ඉදිකර තිබෙනවා. එහෙත් ඉන් අධ්‍යාපනයට එලක් වී නැහැ. සෑම දරුවෙකුටම අධ්‍යාපනය ප්‍රශස්ත ලෙස ලබා දීමට නම් මෙම අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කළ යුතුයි. ජාතික පාසල් පද්ධතියට වඩා පළාත් පාසල් පද්ධතියට දේශපාලනය ඇතුළත් වී තිබෙනවා. ඔවුන්ගේ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා පළාත් පාසල්වල ගුරුවරුන් එකතු කරගෙන තිබුණා. දේශපාලන වුවමනාවට දරුවන් වින්දිතයන් වෙලා. පළාත් පාසල්වලට වඩා ජාතික පාසල්වලට වැඩි සැලකිලි තිබෙනවා කියා දෙමාපියන් අතර මතයක් තිබෙනවා. එය වෙනස් කළ යුතුයි. ඒ නිසා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා හොඳ සංවාදයක් ගොඩනැගිය යුතුයි.

ශ්‍රී ලංකාවට දැනට තිබෙන මානව සම්පත් ගැටලුවේදී නියමිත ධාරිතාව තිබෙන කණ්ඩායම් නැහැ. වෘත්තීමයභාවය සහිත නිලධාරීන් ප්‍රමාණවත්ව නැහැ. එම නිසා මේ රාජ්‍ය දේහය බිඳ වැටෙමින් තිබෙනවා. හොඳ මානව සම්පතක් ශ්‍රම බලකායක් අවශ්‍යයි. ඒ නිසා මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණය නිශ්චිතවම කළ යුතුයි. එය දේශපාලන අරමුණක් නොවේ. එය සමාජයීය අරමුණක්. එයට සියලු දෙනාම දායක වෙන්න.

# අපේ අවසන් අරමුණ...

03 පිටුවෙන්

කියලා. පැහැදිලිවම කියනව නම් එවකට රාජ්‍ය පාලනයේ නිරත වුණු දකුණේ නායකයින් වගේම, උතුරේ ජාතිවාදී නායකයින්ද මීට වගකිව යුතුයි.

***කළු ජූලිය සම්බන්ධ චෝදනාව ජ.වි.පෙ. ඇතුළු වමේ පක්ෂ 3කට පටවලා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා ජ.වි.පෙ.ත් තහනම් කලා. මේ පසුබිම ඔබ දකින්නේ කොහොමද?***

ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ එවකට ජේ.ආර්. ජයවර්ධනට වගේම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට විශාල හිසරදයක් වෙලා තිබ්බ පක්ෂයක්. ජනතා විමුක්ති පෙරමුණ ගෙන ගිය දැඩි ආණ්ඩු විරෝධී මතවාදය ඊට හේතු වුණා. විශේෂයෙන් මැතිවරණ කල්තැබීම හා ජනමත විචාරණ මැතිවරණ මංකොල්ලය වගේ රටට අහිතකර තීන්දු තීරණ ගන්නකොට ජ.වි.පෙ. ඊට එරෙහිව ජනතාව දැනුවත් කරමින් නීතිමය පියවර ගනිමින් සිටියා. ජනතා විමුක්ති පෙරමුණට විශාල ජනතා ප්‍රසාදයක් ලැබෙමින් ජනතාව ඒවා එකතු වෙමින් සිටි බව මේ නායකයෝ දුර තබා දැක්කා. ඒ නිසා තමයි එක් වතාවක ජේ.ආර්. ජයවර්ධන ප්‍රසිද්ධ රැස්වීමකදි කියන්නේ "රොහාන් විජේවීරගේ ජනතා විමුක්ති පෙරමුණ තමයි ආණ්ඩුවට ඉන්න එකම අභියෝගය" කියලා.

ඒ නිසා කළු ජූලිය හේතුවක් කරගෙන ඒ මොහොතේදී වික්‍රමබාහු කරුණාරත්නගේ පක්ෂයත්, වාසුදේව නානායක්කාරගෙ පක්ෂයත් ජනතා විමුක්ති පෙරමුණත් තහනම් කරනවා. නමුත් සති තුනක් වගේ කාලයක් ඇතුළත අනිත් පක්ෂ දෙකේම තහනම ඉවත් කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ තහනම දිගටම පවත්වාගෙන යනවා. ඒ වගේම ජ.වි.පෙ. නායකයින්ම සහ ක්‍රියාකාරීන්ව මර්දනය කරන්න පටන් ගන්නවා.

ආණ්ඩුවට තිබුණු එකම අභියෝගයට පිළිතුරක් විදියට තමයි ආණ්ඩුව ඒ වෙලාවේදී ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කරන තීන්දුව ගන්නේ. දේශපාලනික වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ අක්‍රීය කිරීම තමයි ඒ මොහොතේදී ඔවුන් භාවිත කරපු උපාය මාර්ගය. ජනතා විමුක්ති පෙරමුණ ගෙන ගිය මතවාදය යටපත් කිරීමේ උපක්‍රමයක් ලෙස තමයි ඔවුන් එය සිදු කළේ.

***2024 අවසානයේ ලංකාවේ ජනතාව දුන් ජනවරම තුළින් සියලු ආකාරයේ ජාතිවාදී දේශපාලනය පසෙකට තල්ලු කළා. මේ ස්වර්ණමය අවස්ථාවේ ජාතික සමගිය වෙනුවෙන් ආණ්ඩුවේ ප්‍රවේශය මොන වගේ එකක්ද?***

ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ වෙද්දි හඳුනාගෙන තියෙනවා ලංකාවේ සියලුම පළාත්වලට එක හා සමානව සංවර්ධනය ව්‍යාප්ත වෙලා නැහැ කියන එක. විශේෂයෙන්ම අපි පහුගිය දවස්වල උතුරට ගියාමත් දැක්කා, උතුරේ ජනතාව මුහුණ දීලා තියෙන ප්‍රශ්න සහ ඔවුන්ගේ ජීවන තත්වය පිළිබඳව. අපි විශ්වාස කරනවා ජාතික සමගිය ගොඩනැගීමට නම් මේ සියලු පළාත්වලට සංවර්ධනය එක හා සමානව ගලාගෙන යා යුතුයි කියන එක. ඔවුන් රටේ ආර්ථිකයේ කොටස්කරුවන් බවට පත්වෙමින් ක්‍රමානුකූලව ආණ්ඩුව සමඟ ඍජු සම්බන්ධතාවයක් ගොඩනගා ගත යුතුයි කියලා.

මොකද තවදුරටත් හුදකලාව සිටීම හෝ වෙන්කොට සැලකීම තුළ මෙයට විසඳුමක් ලැබෙන්නේ නැහැ. අපි කිසි ලෙසකින්වත් රට පළාත් අනුව බෙදමින් පාලනය කිරීමකට ගමන් කරන්නේ නැහැ. සංවර්ධන ක්‍රියාවලියේදී සමස්ත රට ලෙස සලකා මේ සංවර්ධන කටයුතු සිදුකිරීම තුළින් ඔවුන්ටත් හැඟීමක් දැනෙනවා මේක තමන් ජීවත්වෙන රට කියලා. විශේෂයෙන්ම ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේත් විශේෂ අවධානයක් උතුරට යොමු වෙලා තියෙනවා. විශේෂයෙන්ම යාපනය දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට ජනාධිපතිවරයා අවස්ථා කිහිපයකදීම සහභාගි වුණා. ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව ඔවුන් සමඟ එකට හිඳිමින් සාකච්ඡා කළා. අපි දන්නවා මීට පෙර ගත්තහම ආණ්ඩුවට උතුර දිනා ගැනීමට නොහැකි වීම නිසා සහ උතුරේ සිටි ඇතැම් ජාතිවාදී නායකයින් විසින් ගෙනගිය ක්‍රියාවලිය තුළ උතුරේ ජනතාවට මේ තමන්ගෙම රට කියන හැඟීම ඇතිවෙන්න ඉඩක් දුන්නේ නැහැ. ඔවුන්ව බෙදලා වෙන් කරලා පාලනය කිරීමක් තමයි සිද්ධ වුණේ.

නමුත් අපිට කිසිදු ලෙසකින් මේ රට බෙදා වෙන්කර පාලනය කිරීමේ වුවමනාවක් නැහැ. අපි දකින්නේ ශ්‍රී ලංකාව සමස්ත රට විදිහට. උතුර, දකුණ, නැගෙනහිර ආදී විදිහට නෙවෙයි. ඉස්සර උතුරේ ජනතාව කිවුවේ "කොළඹ තියෙන දකුණේ ආණ්ඩුව උතුරෙ මිනිස්සු ගැන සැලකීමක් නැහැ" කියලා. නමුත් අපි දැන් ඔවුන්ට සමීප වෙමින් මේ ජාතික සමගිය ගොඩනැගීමේ ප්‍රවේශය අරන් තියෙනවා. එහි වැදගත් පියවරක් මේ වසරේ "ශ්‍රී ලාංකේය දිනය" සමඟ එළඹෙයි කියන විශ්වාසය අප තුළ තියෙනවා.

***මේ සම්බන්ධව රටේ තරුණ පරපුර සතුව පවතින කාර්යභාරය මොනවගේ එකක් කියලද ඔබ හිතන්නේ?***

මෙතෙක් කල් රට පාලනය කරපු සියලු පාලකයින් විසින් ජාතික සමගිය සහ ආගමික සංහිඳියාව ඇති කිරීම වෙනුවට ජාතිකත්වයන් හා ආගමික කණ්ඩායම් අතර විරසකභාවයත් අසමගියත් වර්ධනය කරලා තමන්ගේ පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීම. ඔවුන් සියලු ජන කොටස් අතර සහෝදරත්වය, අන්‍යෝන්‍ය විශ්වාසය වගේම සමගිය ගොඩනැගීමට හා සමාජ සංස්කෘතික හර පද්ධතින් තහවුරු කිරීමට අසමත් වුණා වගේම විරසකය ඔවුන්ගේ බලය රැක ගැනීමේ උපායමාර්ගයක් විදිහට භාවිත කළා. එහි ප්‍රතිඵල විදිහට ජාතිවාදී සහ ආගම්වාදී ගැටුම් රාශියකට මුහුණ දීමට අපිට සිද්ධ වුණා. දශක තුනක් පුරාවට දස දහස් ගණනකට ජීවිත හා දේපළ අහිමි කරමින් දිග ඇදුණු යුද්ධයක්, ඒ වගේම පාස්කු ඉරුදින ප්‍රහාරය වැනි මෑතකාලීන සිදුවීම් මගින් ශ්‍රී ලාංකේය ජාතිය ලෙස ගොඩනැගීමේ දිශාවෙන් බොහෝ ඈතට අපිව ගෙන ගියා. මේ සියල්ලෙන්ම වැඩිපුරම පීඩාවට පත්වුණේත් බලපෑමට ලක්වුණෙත් මේ රටේ තරුණ ප්‍රජාවයි. නමුත් දැන් මේ සිදුවී තිබෙන දේශපාලනය පරිවර්තනයත් එක්ක අපිට හැකියාව ලැබිලා තියෙනවා නැවතත් මේ රට ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ දිශාවට රැගෙන යන්න.

අපි විශ්වාස කරනවා මේ රටේ තරුණ පරම්පරාවට තමයි මෙහි විශාල කොටසක කාර්යභාරය ඉටු කරන්න තියෙන්නේ කියලා. ජාතික සමගිය ඇති කරන්න පුළුවන් ඒ ශක්තිය තියෙන්නේ මේ රටේ තරුණ පරම්පරාව සතුවයි. දශක ගණනාවක් පුරා අපි මුහුණ දීපු බරපතළම තත්ත්වය තමයි භාෂාව සන්නිවේදනය සඳහා බාධකයක් වීම. සිංහල තරුණයාට දමිළ බැරි වීමත් දමිළ කෙනාට සිංහල බැරිවීමත් තුළ අපි තවදුරටත් ඈත් වුණා. ඒ වගේම මේ දෙපාර්ශවයටම සන්නිවේදනය කර ගත හැකි භාෂාවක් විදිහට ඉංග්‍රීසි භාෂාව භාවිත කළ හැකි වුණත් ඉංග්‍රීසි භාෂා දැනුමේ මදිකමත් මේ ඈත් බව තවදුරටත් පවත්වාගෙන යන්න රුකුලක් දුන්නා. අතීතයට සාපේක්ෂව ගත්තහම අද වෙද්දි මේ රටේ තරුණ පරම්පරාව අතර භාෂාත්මක දැනුම ඉහළ මට්ටමකින් තියෙනවා. ඒ වගේම ඉදිරියේදී අපි තරුණයන් වෙනුවෙන් සිදුකිරීමට නියමිත වැඩසටහන් තුළ මේ භාෂා දැනුම ලබාදීම කියන එකට ප්‍රමුඛතාවයක් ලබා දීලා තියෙනවා. ඒ නිසා අපි හිතනවා ඉදිරියේදී මේ සන්නිවේදන බාධක ඉවත්වීම ඇතුලේ මේ ජාතීන් අතර යම් ඒකාබද්ධ වීමක් ඇති කරන්න පුළුවන් වෙයි කියලා. ප්‍රජාතන්ත්‍රවාදය සමානාත්මතාවය සාමූහික වගකීම හා විවිධත්වය පිළිගනිමින්ද අනෙකාට ගරු කරමින්ද ජීවත්වන නවීන තරුණයෙක් සහ තරුණියක් ගොඩනැගීම කියන වගකීම අප භාරගෙන තිබෙනවා.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com



මල්වතු-අස්ගිරි උභය මහා විහාරයීය ස්වාමීන් වහන්සේලා සමඟ...





කළු ජූලියේ අඳුරු මතක වෙනුවට ජාතීන් අතර එකමුතුකමේ පණිවිඩය රැගෙන...



ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන අරඹා...



'පුංචි අපට ලොව දිනන්න' සෙල්ලමටත් ඉඩක් දෙන්න මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාතික සතියේ අරම්භය...



'එක මිටට ගොවි බිමට' ජාතික වැඩසටහන අරඹා...

# කෘෂිකර්මාන්තයට ලොකු පිම්මක් අවශ්‍යයි

## කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් වාරිමාර්ග හා මහවැලි අමාත්‍ය ලාල්කාන්ත සහෝදරයා

ලංකාවේ වැඩ කරන ජනතාව අතර දුප්පත්ම කණ්ඩායම ගොවීන් වන බවත් දුෂ්කර ජීවිත ගත කරන ඔවුන් ගැටලු ගණනාවකට මුහුණ දී සිටින බවත් රජයේ අභියෝගය ඔවුන්ගේ ජීවිත මධ්‍යම පාන්තික මට්ටමට ගෙන ඒම බවත් පෙන්වා දුන් කෘෂිකර්ම පශු සම්පත්, ඉඩම් වාරිමාර්ග හා මහවැලි අමාත්‍ය කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා ඒ වෙනුවෙන් කෘෂිකර්මාන්තය විශාල පිම්මක් ගත යුතුව ඇති බව අවධාරණය කළේය.

ලාල්කාන්ත සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 27 දින මොනරාගලදී පැවති "එක මිටට - ගොවි බිමට" ව්‍යාපෘතියේ ආරම්භක අවස්ථාවකට සහභාගි වෙමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ලාල්කාන්ත සහෝදරයා මෙසේද පැවසීය.

කෘෂිකර්මට අදාළ ජාතික ආයතන ටික එකම අමාත්‍යාංශයක් යටතට පත්කර තිබෙන්නේ මේ ඉලක්කය සාර්ථක කර ගන්න. ඉස්සර ඇමතිවරු තම තමන්ගේ තනි තනි පුද්ගලික න්‍යාය පත්‍රවලට දුවන්න අවශ්‍ය විදිහට කෘෂිකර්ම, පශු සම්පත් සහ මහවැලිය වගේ අමාත්‍යාංශ වෙන වෙනම පිහිටුවා තිබුණා. සමහර කාලවල මහවැලියට විතරක් එක ඇමති කෙනෙක් ඉඳලා තිබෙනවා. පශු සම්පත් හැමදාම තිබුණේ තොණ්ඩමන් මහත්තයාට. ආණ්ඩුවේ කොටස්කරුවන් සම්බන්ධ කර ගත්තේ ඒ විදිහට. බලයට එන්න කලින් ජාතික ජන බලවේගය කතා කළ වැඩසටහන් අනුව මේ ආයතන ඔක්කෝම එකට අරගෙන කැබිනට් ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරු දෙදෙනෙක් යටතට පත්කර තිබෙනවා. ඊට අමතරව දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු රාජ්‍ය නිලධාරීන් වගේම ගොවි ජනතාවත් එකට සම්බන්ධ කරගෙන අපේ රටේ ආහාර සුරක්ෂිතතාව ඇතිකර ගොවි ජනතාවගේ ජීවිත ඉහළ මට්ටමකට ගෙන එන්න ක්‍රියාකරමින් සිටිනවා.

බිම් මට්ටමේ අවශ්‍ය කටයුතු සිදුකෙරෙනවාද, වේගය ඇතිද, මදිද, හොරකම්, වංචා දූෂණ සිදු කෙරෙනවාද, වෙනත් අඩුපාඩුකම් සිදු වෙනවාද, කියලා සොයා බලන්න ඕනෑ. එහෙම නොකර මොන ජනාධිපති ආවත් මොන ඇමති ආවත් අපිට ප්‍රතිඵල ගන්න ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම වාරිමාර්ග ප්‍රතිසංස්කරණවලදී මුහුණ දෙන ගැටලුවක් තිබෙනවා. වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අවුරුද්ද පුරාම වැඩ කරන්න පුළුවන්. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට වැඩ කරන්න තිබෙන්නේ නිරිතදිග සහ ඊසානදිග මෝසම් වැස්ස නැති කාලවලදී විතරයි. මාස් කන්නයේ වැව් පිරුණාට පස්සේ වාරිමාර්ග සහ ජලාශවල ප්‍රතිසංස්කරණ කරන්න බැහැ. වැව්වල, ඇළවේලිවල ප්‍රතිසංස්කරණය කරන්න නම්, යල්



කන්නය සහ මාස් කන්නය අතර විරාම කාල පාවිච්චි කරන්න වෙනවා. අයවැයෙන් කොච්චර සල්ලි වෙන් කළත් කෙටිකාලයක් තුළ විශාල වැඩකොටසක් කිරීමේ අභියෝගය අපිට තිබෙනවා.

ගොවි ජනතාවට ළඟම රාජ්‍ය නිලධාරියා වන කෘ.ප.නි.ස. මහත්තයාගේ ඉඳලා පළාත් පාලන ආයතනවල, කොට්ඨාසවල මහජන නියෝජිතයන් ඇතුළු එතනින් ඉහළ සියලුම දෙනාට කාර්යශීලී වැඩකටයුතු රාශියක් තිබෙනවා. රටේ ජනතාවගේ බදු මුදල් කෘෂිකර්මාන්තයේ පිම්මක් ලබාගෙන සංවර්ධනය කිරීම වෙනුවෙන් යොදාගත හැක්කේ අපි හැමෝම ක්‍රියාශීලීව හොඳින් වැඩ කළොත් විතරයි. ජන මාධ්‍යවලටත් පිස්සු කෙළිමෙන් එහා ගිය විශේෂ විමර්ශනාත්මක වාර්තා කිරීම් අපි බලාපොරොත්තු වෙනවා. මේ රට ගොඩනගන්න නම්, ජනමාධ්‍ය ආයතනවලට ධනාත්මක මැදිහත්වීමක් අවශ්‍යයි.

# ඔබේ ඉලක්කය රටේ ඉලක්කයක් බවට පත්කර ගන්න

## කර්මාන්ත හා ව්‍යවසායකත්ව අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා

තමන් ගෙවන බදු මුදල් ආණ්ඩුව නාස්ති කරන බවටත් බදුවලින් තමන්ට යමක් නොලැබෙන බවටත් වූ අතෘප්තිකර හැඟීමක් ජනතාව අතර තිබූ නමුත් ආණ්ඩුවක් ලෙස මෙම අදහස වෙනස් කරමින් යන බව කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා පැවසීය.

නීතියේ ආධිපත්‍යය තහවුරු වනවිට හා එයට දේශපාලන ඇඟිලි ගැසීම් නොමැති විට නීතිය පිළිබඳව ජනතාවට විශ්වාසයක් ඇති වෙන බව පෙන්වා දුන් හඳුන්නෙත්ති සහෝදරයා කාලය අපතේ නොයවා රාජ්‍ය ආයතනයකින් වැඩක් කර ගත හැකි බවටද විශ්වාසයක් ඇති විය යුතු බව කියා සිටියේය. අමාත්‍යවරයා මේ බව පැවසුවේ පසුගිය 29දා මහනුවර ප්‍රදේශයේ පැවැති ව්‍යවසායකයින්ගේ හමුවකදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හඳුන්නෙත්ති සහෝදරයා මෙසේද පැවසීය.

මධ්‍යම පළාතෙන් අපනයන ආදායමට දායක වෙලා තිබෙන්නේ ඩොලර් මිලියන 179ක් පමණයි. නමුත් මේ පළාතේ තිබෙන ශක්‍යතාවය අනුව අපි බලාපොරොත්තු



වෙනවා ඩොලර් මිලියන 500කට යන්න. ඔබ පෞද්ගලික ව්‍යාපාරයක නිරත වුණත්, ඩොලර් මිලියන 500යේ ඉලක්කයට යන්න උත්සාහ ගන්න ඕනෑ. අපි තේ කර්මාන්තයෙන් බලාපොරොත්තු වෙන්නේ මිලියන 400ක ඉලක්කයක්. ඒ ඉලක්කයේ හවුල්කරුවන් බවට පත්වෙන්න ඕනෑ. රජය හදන ආර්ථික ඉලක්ක ජනතාව අතර බෙදාහදාගෙන, ජන සහභාගිත්වයෙන් එම ඉලක්ක සම්පූර්ණ කර ගැනීම තමයි අපේ අරමුණ වී තිබෙන්නේ.

ඒ වෙනුවෙන් අපේ කර්මාන්තකරුවන්, ආයෝජනයෙන් පෙළ ගස්වන්න ඕනෑ. ඒ වෙනුවෙන් මේ අවුරුද්දේ ඉදිරි කාලය තුළ හොඳ ආයෝජකයන් අවම වශයෙන් 50ක්වත් මධ්‍යම පළාතට හඳුන්වා දෙන්න ඕනෑ. ජාත්‍යන්තර ආයෝජකයන්ගේ සමුළුවක් නුවර, නුවරඑළියේ පවත්වන්න ඕනෑ. මේ රටේ හැකියාව, ස්වභාව සෞන්දර්යය වගේම ආයෝජන සක්‍යතාවයත් ඔවුන් අවබෝධකර ගන්න ඒ තුළින් ක්‍රියාකරනවා. කොළඹට ඇවිත් යනවා වෙනුවට පවතින විවිධත්වය, අවස්ථා අත්දැකීමෙන් අවබෝධ කරගන්න අවස්ථාව දිය යුතුයි. ආයෝජනවලට බාධා කෙරෙන පැරණි නීති රීති ඉතා ඉක්මනින් නිරවුල් කරන්න ක්‍රියාකරනවා. ඔබට අවශ්‍ය බැංකු පහසුකම්, වෙනත් යටිතල පහසුකම් ඉතා ඉක්මනින් ලබාදෙන්න අපි ලැහැස්තියි. මේ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන ඔබේ පුද්ගලික ඉලක්කය රටේ ඉලක්කයක් බවට පත්කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

# මත්ද්‍රව්‍යවලට එරෙහි ඒකාබද්ධ මෙහෙයුමක් අරඹා තිබෙනවා

## මහජන ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ සුනිල් වටගල සහෝදරයා

කොළඹ මහල් නිවාසලාභීන්ගේ ජන ජීවිත මත්ද්‍රව්‍ය ජාවාරම නිසා ඉතාමත්ම ඛේදජනක තත්වයකට ඇදවැටී තිබෙන බවත් මේ තත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා රජයක් ලෙස පියවර ගනිමින් සිටින බවත් ප්‍රකාශ කළ මහජන ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය නීතිඥ සුනිල් වටගල සහෝදරයා, මත්ද්‍රව්‍ය අවදානම පිළිබඳව දිවයින පුරා ජනතාව දැනුවත් කිරීම, නාකොටික් ආයතනය මගින් මර්දනය කිරීම සහ ඇබ්බැහිවූවන් විධිමත්ව පුනරුත්ථාපනය කර සමාජගත කිරීම සඳහා ඒකාබද්ධ ක්‍රියාදාමයක් අරඹා ඇති බව කියා සිටියේය.

සුනිල් වටගල සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 26වැනි දින වනාතමුල්ල ප්‍රදේශයේ පැවති දැනුවත් කිරීමේ හමුවක් අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වටගල සහෝදරයා මෙසේද පැවසීය.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු රැස්කරමින් ඇබ්බැහිවූවන් මුදා ගැනීම සඳහා දින 14ක පුනරුත්ථාපන කඳවුරක් පවත්වන්න සැලසුම් කර තිබෙනවා. කෙටිකාලීන පුනරුත්ථාපනයෙන් මුදවා ගන්න බැරි අය මාස තුනක පුනරුත්ථාපනයකට යටත් කරනවා. ඒ අතරතුර ඔවුන් වෙනුවෙන් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදී රැකියාවලට යොමු කිරීමේ සැලසුමක් දම්වැලක පුරුක් සේ එකිනෙකට සම්බන්ධ කරමින් ක්‍රියාත්මක කරනවා. පුද්ගලයන් දැනුවත් කිරීම්වලින් පසුව අත්හරින්නේ නැතිව, හොඳ පුරවැසියෙක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අපි සෑම අංශයක්ම ඒකාබද්ධව ක්‍රියාත්මක කරනවා. ඒ අතර මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවනුත් නවීන තාක්ෂණික මෙවලම් බෙදාගන්නා තැනට දියුණු වෙලා. ඒ සම්බන්ධ නිසි අවබෝධයක් පොලිස් දෙපාර්තමේන්තුවට තිබෙනවා. 'ඊසි කෑෂ් සහ ඊ කෑෂ්' මගින් සිදුකරන නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම මැඩලන්න විශේෂ මෙහෙයුම් ආරම්භ කර තිබෙනවා. ඒ වගේම මත්ද්‍රව්‍ය මැඩලීමේ නොනවතින රැල්ලක් ලෙස විශේෂ පොලිස් මෙහෙයුම් සෑම ප්‍රදේශයකම ක්‍රියාත්මක කරමින් සිටිනවා. ජාවාරම්කරුවන් නීතියේ රැහැනට කොටුකර ගන්න වෙරළාරක්ෂක බලකාය, පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව ඒකාබද්ධ මෙහෙයුම් දියත් කර තිබෙනවා. විශේෂයෙන්ම කොළඹ මහ නගර සභා බලසීමාව තුළ අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කරමින්



විශේෂ මෙහෙයුමක් සැලසුම්කර තිබෙනවා. මත්ද්‍රව්‍ය ජාවාරම් මර්දනය පොලීසිය ඇතුළු ආරක්ෂක අංශවලට පමණක් කළ නොහැකියි. ඒ වෙනුවෙන් සියලු දෙනාගේම සහයෝගය අවශ්‍යයි. දේශපාලන අධිකාරියේ අරමුණ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට ගොදුරු වන ජනතාව බේරා ගැනීම වෙනුවෙන් මෙහෙයුම් දියත් කිරීමයි. ජනවරමේ හරය ඒකයි. ඒ ජනවරම ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය සේවය ඇතුළු අවශ්‍ය අංශ සියල්ලම ඒකාබද්ධ කර මෙහෙයවමින් සිටිනවා.

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.